www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලේඛනාගාරයෙන්*

# සංහාරයෙන් ඉක්බිති: බෝල්කන් යුද්ධයේ දේශපාලන පාඩම්

**From the archive of the WSWS**
**After the Slaughter: Political Lessons of the Balkan War**

**ඩේවිඩ් නෝත් විසිනි**

**2008 පෙබරවාරි 20**

*කොසෝවෝ පලාත ස්වාධීනත්වය ප්‍රකාශයට පත් කිරීම වටා සිදු වන මෑත වර්ධනයන්ගේ ආලෝකය තුල ලෝක සමාජවාදී වෙබ් අඩවිය 1999 ජූනි 14 දා මුලින් ම පල කෙරුනු පහත ලිපිය යලි පල කිරීමට තීර්නය කර ඇත*

## නව ශතවර්ෂය ආරම්භයේ දී

සර්බියාව, එක්සත් ජනපද-නැටෝ ප්‍රහාරය ඉදිරියේ යටත්වීම විසිවන සියවසේ අවසාන ප්‍රධාන මූලෝපායික අත්දැකීම සමාප්ත කරයි. එහි ලේවැකි නිගමනය විසිවන සියවසට එක්තරා ඛේදජනක සමතුලිතතාවක් අත්කර දෙයි. මෙම සියවස ඇරඹුනේ චීනයේ බොක්සර් කැරලිකරුවන්ගේ යටත් විජිත විරෝධී නැගිටීම පාගා දැමීමත් සමග ය; සමාප්ත වන්නේ බෝල්කන් ප්‍රදේශය ප්‍රමුඛ අධිරාජ්‍ය බලවතුන්ගේ නව යටත් විජිත වැයික්කියක තත්වයට පත් කරමිනි.

එක්සත් ජනපදයේ මිසයිල සහ බෝම්බවලින් සර්බියාවට සහ කොසොවෝවට අත්කරදුන් විනාශයේ සම්පූර්න පරිමාව තක්සේරු කර ගැනීමට තව කල් යනු ඇත. සර්බ් සන්නද්ධ යුද හමුදාවලට මුහුන පාන්නට සිදු වූ මරන සංඛ්‍යාව 5,000ක් පමන යයි කියනු ලැබේ. හමුදා තුවාලකරුවන් සංඛ්‍යාව එමෙන් දෙගුනයක් පමන යයි සලකනු ලැබේ. සිවිල් ජනයා අ- වසයෙන් 1,500ක් මරා දමනු ලැබ ඇත. ගුවන් ප්‍රහාරක ගමන් 35,000ක් සිදු කල එක්සත් ජනපද ගුවන් හමුදාව -- තම යුරෝපීය ආධාරකරුවන්ගේ ද සහාය ලැබ -- යුගෝස්ලාවියාවේ කාර්මික හා සමාජ පොදු කාර්යව්‍යුහයෙහි අතිවිශාල කොටසක් සුන් කර දැම්මේ ය. ඒ රටේ පෙට්රෝලියම් සම්පත්වලින් සියයට 57ක් හානියට හා විනාශයට පත් කරන ලද බව නැටෝව ම පිලිගනී. සියලු ම මහා මාර්ග, දුම්රිය මාර්ග සහ පාලම් මහා පරිමානව බෝම්බ දමා විනාශ කර ඇත. විදුලි ට්‍රාන්ස්ෆෝමර, මධ්‍යම බල ශක්ති මධ්‍යස්ථාන සහ ජල පිරිපහදු පද්ධති, එනම් වත්මන් නාගරික මධ්‍යස්ථානයක් රැඳී පවත්නා සියලූ දේ, දැන් වැඩ කරන්නේ බෝම්බ දැමීමට පෙර පැවති ධාරිතාවෙන් ඉතා සුලු පංගුවක් වසයෙන් පමනි. කර්මාන්ත ශාලා හා වැඩපල විනාශ කර දැමීම නිසා කම්කරුවන් ලක්ෂ ගනනකට ජීවනෝපාය අහිමි වී ඇත. ප්‍රධාන රෝහල් බෝම්බ දැමීම නිසා බරපතල හානියට පත්ව තිබේ. ලක්ෂයක් ලමයින් ගිය පාසල් ගොඩනැගිලිවලට බරපතල හානි වී නැතහොත් මුලුමනින් ම විනාශ වී තිබේ.

නැටෝව විසින් විනාශ කර දමන ලද දේ යලි ගොඩනැගීමේ වියදම ඩොලර් බිලියන 50ත් 150ත් අතර වෙතැයි ගනන් බලා ඇත. මින් වඩා අ- මුදල වුව යුගෝස්ලාවියාව අත ඇති සම්පත්වලට ඔරොත්තු නො දෙයි. මේ වර්ෂයේ රටේ දල ජාතික නිෂ්පාදිතය සියයට 30කින් පහත වැටෙතැයි අපේක්ෂා කෙරේ. පසුගිය මාස දෙක ඇතුලත පාරිභෝගික වියදම් තුනෙන් දෙකකින් පමන පහත වැටුනි. විදේශීය ආධාරවලින් තොරව, යුගෝස්ලාවියාවට ආර්ථික වර්ධනයේ 1989 පැවති ඉතා සොච්චම් මට්ටම් කරා ලඟාවීමට පවා අවුරුදු 45ක් ගතවනු ඇත.

යුගෝස්ලාවියාවට බෝම්බ දැමීම අධිරාජ්‍යවාදය සහ කුඩා ජාතීන් අතර පවත්නා සැබෑ සබඳකම් එලිදරව් කරයි. 20 වන සියවසේ ප්‍රථම වර්ෂවල දී අධිරාජ්‍යවාදය පිලිබඳව කරන ලද -- හොබ්සන්, ලෙනින්, ලක්ෂම්බර්ග් හා හිල්ෆර්ඩිංගේ -- මහා චෝදනා සමකාලීන ලියවිලි ලෙස පෙනී යයි. ආර්ථික වසයෙන් ගත් කල්හි, කුඩා ජාතිහු ප්‍රධාන අධිරාජ්‍යවාදී රටවල නය දෙන සංවිධානවල ද මූල්‍ය සංස්ථාවල ද අත යට පවතී. දේශපාලන ක්ෂේත්‍රයේ දී මෙම රාජ්‍යය තම ස්වාධීන අවශ්‍යතා අත් කර ගැනීමට දරන්නා වූ කුමන ප්‍රයත්නයක් වුව ව්‍යසනකාරී මිලිටරි දන්ඩනයක තර්ජනය ගෙන ඒ. වඩවඩාත් නිරන්තරව කුඩා රාජ්‍යයෝ ඒවායේ ජාතික ස්වාධිපත්‍යයට අහිමි කරනු ලැබ, විදේශීය මිලිටරි ආක්‍රමනයට යටත්වීමට බල කරනු ලබන තත්වයකට ඇද වැටෙති. අන්තිමේ දී මෙම රටවලට සිදු වී ඇත්තේ සාරභූත වසයෙන් ම යටත් විජිත ස්වභාවයක් දරන්නා වූ පාලන රූපයන්ට යටත්වීමට ය. සමකාලීන සිද්ධීන් දෙස බලත් බලත්, 1940 ගනන් 1950 ගනන් හා 1960 ගනන්වල දී පැරනි යටත් විජිත අධිරාජ්‍ය ගලවා දැමීම වනාහි අධිරාජ්‍යවාදයේ ඉතිහාසයෙහි තාවකාලික සිද්ධියක් පමනක් ය යන්න වඩවඩාත් තහවුරු වී යයි.

යුගෝස්ලාවියාවට එල්ල කරන ලද ප්‍රහාරය යුද්ධයකට වඩා සංහාරයක් යයි නිර්වචනය කල හැකි ය. යුද්ධයක දී නම්, දෙපැත්ත අතර සටන් ඇති විය යුතු ය. එහි දී දෙපක්ෂයට ම කිසියම් අවදානම් තත්වයන්ට මූන දීමට සිදු වේ. දෙපිල අතර බල තුලනයේ මේ තරම් අසමානතාවක් පැවත්තා වූ යුද්ධ ඝට්ටනයක් ඉතිහාසයේ කවර කලෙක වත් දක්නට ලැබී නැත. පෝලන්තයට, ඕලන්දයට සහ නෝර්වේ දේශයට එරෙහිව එල්ල කරනු ලැබූ හිට්ලර්ගේ ලේ වැකි, ඒක පාක්ෂික ප්‍රහාරයන්හි දී පවා ජර්මන් හමුදාවන්ට සැලකිය යුතු අනතුරුදායක තත්වයන්ට මුහුන දීමට සිදු විය.

එක්සත් ජනපදයට පසුගිය යුද්ධයේ දී එවන් ප්‍රාථමික මට්ටමක හෝ අවදානමකට මුහුන දීමට සිදු වූයේ නැත. අහක යන වෙඩි උණ්ඩයකට හෝ ගොදුරුව එකම ජීවිතයක් හෝ නැති කර ගන්නේ නැතිව, නැටෝවේ ගුවන් නියමුවෝ ද මිසයිල යවන පරිගනක පද්ධති මෙහෙයවන්නෝ ද යුගෝස්ලාවියාවේ මේ සා පරිමාන ප්‍රදේශයක් විලෝපනය කලාහු ය. ප්‍රතිමල්ල දෙපාර්ශවයේ යුද සම්පත් අතර පැවති අසමානතාව මෙම යුද්ධයේ නිර්නක ලක්ෂණයක් විය. 20 වන සියවස අග දී අධිරාජ්‍යවාදී බලවතුන් විසින් පාලනය කරනු ලබන ආර්ථික සම්පත් ඔවුන්ගේ තාක්ෂණික ආධිපත්‍යය සහතික කරන අතර, මෙම ආධිපත්‍යය ඉහවහ යන යුද්ධමය බලයක් බවට පරිවර්තනය කරනු ලැබ ඇත. මෙම ජාත්‍යන්තර රාමුව තුල, ඇමරිකා එක්සත් ජනපදය, ඒ හෝ මේ හේතුව නිසා තමන්ට බාධාවක් බවට පත්ව සිටින මුලුමනින් ම පාහේ අනාරක්ෂිත වූ අ- දියුනු රටවල් බිය කොට, භීෂනයට ලක් කොට ඕනෑ නම් මුලුමනින් ම වනසා දැම්මට නියත-මෙහෙයුම් අවි අංශයේ තමන්ට ඇති තාක්ෂණික ආධිපත්‍යය යොදා ගන්නා ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රධාන පිඩක අධිරාජ්‍යවාදී ජාතිය ලෙස ඉස්මත්තට පැමින සිටී.

යුද්ධමය පැත්තෙන් ගත් කල්හි, මෙම බෝම්බ ව්‍යායාමය එක්සත් ජනපදයේ යුද යන්ත්‍රයේ මාරක ධාරිතාව විදහා දක්වා ඇත. එම රාජ්‍යයට අවි ආයුධ සපයන කොන්ත්‍රාත්කරුවෝ තමන්ට ම හිතිය ප්‍රකාශ කර ගනිති; පෙන්ටගනය යෙදූ ආයුධ වෙනුවට අලුත් ආයුධ මිල දී ගැනීමට යන විට, එයින් ලැබෙන්නට යන නව අවි මිල දී ගැනීමේ ඇනවුම් අපේක්ෂාවෙන් ඔවුහු තොල් ලෙවකමින් සිටිති. එහෙත් සර්බියාව යටත් කර ගැනීම වනාහි එක්සත් ජනපදයට ප්‍රතිවිපාකදායි ජයග්‍රහනයකි. එක්සත් ජනපදය බෝල්කන් ප්‍රදේශය තුල තම කෙටිකාලීන අවශ්‍යතා දිනාගෙන තිබෙනවා ඇත්ත ය; එහෙත් එය ලබා ගෙන ඇත්තේ දිගුකාලීන වසයෙන් යෝධ දේශපාලන වියදමකිනි. යුගෝස්ලාවියාව විනාශ කිරීම මානව හිතවාදී භාවිතාවක් ලෙස හුවාදැක්වීමට ගෙන යන ලද චාචාල ප්‍රචාරක ව්‍යායාමය තිබිය දී ම එක්සත් ජනපදයේ ජාත්‍යන්තර ප්‍රතිරූපය යලි ගොඩනගා ගත නො හැකි ලෙස විනාශ ව ඇත. සෝවියට් සංගමය බිඳ වැටීම ආශ්‍රිතව ඇති වූ දේශපාලන ව්‍යාකුලත්වයේ වාතාවරනය තුල එක්සත් ජනපදයේ කීර්තිය දෙවන ලෝක යුද්ධ සමයේ අත්පත් කර ගත් උත්කර්ෂවත් මට්ටමට සමාන ඉහල මට්ටමක් කරා නැංගේ ය. ඇමරිකාවේ "ප්‍රජාතන්ත්‍රවාදී" හා "මානවහිතවාදී" ක්‍රියාකලාපය ගැන මිථ්‍යා මත බහුල විය.

මෙම දශකය තුල බොහෝ දේ වෙනස් වී තිබේ. ඒ හෝ මේ සතුරෙකුට විරුද්ධ ව අවසානයක් නැති කෲස් මිසයිල ප්‍රහාර මාලාවක් එල්ල කිරීම, පලල් ජනතාව අතර එක්සත් ජනපද පාලනය කෙරේ පිලිකුල් සහගත හැඟීමක් නිර්මානය කර ඇත. ලෝකය පුරාම අද එක්සත් ජනපදය දකිනු ලබන්නේ තමන්ගේ අවශ්‍යතා අත්පත් කර ගැනීම සඳහා ඕනෑම දෙයක් කිරීමට නො පසුබට වන නිර්දය හා භයානක මැරයෙකු ලෙස ය. චීන තානාපති කාර්යාලයට බෝම්බ හෙලීමත් සමග පිතිනය සොලවා පැතිර ගිය කෝපය, හුදෙක් ස්ටැලින්වාදී තන්ත්‍රයේ ප්‍රචාරය හෝ එය විසින් ජාතෙ‍්‍යාත්තමවාදය අවුලුවාලීමේ ප්‍රතිඵලයක් ම නො වී ය. නැත, පලල්ව වටහා ගනු ලැබ තිබෙන්නේ, දැන් බෙල්ග්‍රේඩ්හි සිදුවෙමින් පවත්නා දෙය තව අවුරුදු කිහිපයකින් පිකිංහි ද සිදුවීමට ඉඩ ඇති බව ය. අධිරාජ්‍යවාදයේ තික්ෂන නියෝජිතයෝ එක්සත් ජනපදයේ ජාත්‍යන්තර ප්‍රතිරූපය පිරිහී යාම සමග ම තමන්ට බරපතල දේශපාලන වන්දියක් ගෙවීමට සිදුවනු ඇතැයි බිය වෙති. මිලොසෙවික් ඇමරිකානු කොන්දේසි පිලිගෙන ඇතැයි මුලින් ම දැන්වූ පසුව ඇමරිකානු ඒබීසී ගුවන් විදුලි ප්‍රවෘත්ති වැඩසටහනක් වූ නයිට්ලයින්හි වටමේස සාකච්ඡාවක දී හිටපු රාජ්‍ය ලේකම් ලෝරන්ස් රගල්බර්ගර් මෙසේ කී ය: "ලෝකය අප ගැන ලබාගෙන තිබෙන දැක්ම නම් අසුනේ ඉඳගෙන බොත්තමක් තද කරන මැරයෙකු ය යන්න ය, එහි ජනයා මැරෙති, අපට ගෙවන්නට වන්නේ මිසයිලයක වියදම හැර අන් කිසිවක් නො වේ ... මේ දැක්ම ඉදිරි අවුරුදු ගනනාවක් තුල ලෝකය සමග ගනුදෙනු කිරීමේ දී අවතාරයක් සේ අපව ලුහුබඳිනු ඇත."

නැටෝ සංවිධානයේ මිතුරන් අතර ම වුව ද, එක්සත් ජනපදයේ ජාත්‍යන්තර කෑදරකම පිලිබඳව ද තමන්ට උවමනා දේ ලබා ගැනීමට ඕනෑම ක්‍රමයක් පාවිච්චි කිරීමට එහි ඇති කැමැත්ත ගැන ද මනස්තාපයක් පවති. යුරෝපීය ජනාධිපතිවරු ද අගමැතිවරු ද ප්‍රසිද්ධියේ එක්සත් ජනපදය ඉදිරියේ දන නමති; සදාකාලික මිත්‍රත්වය ප්‍රකාශ කරති. එහෙත් පෞද්ගලිකව, තමතමන් අතර, සීඅයිඒ සංවිධානය විසින් හොරෙන් කන් දී නැතැයි සිතන "ආරක්ෂිත" කාමර තුල, මොවුහු එක්සත් ජනපදය මීලඟ ප්‍රහාරය එල්ල කරනු ඇත්තේ කොතැනට ද, කාට විරුද්ධව ද යන්න ගැන විමතිය පල කරති. යුරෝපයේ අවශ්‍යතා එක්සත් ජනපදයේ අවශ්‍යතා සමග කෙලින් ම ගැටුන හොත් හා ගැටුනු කල්හි කුමක් සිදුවේ ද? පසුගිය අවුරුද්දේ ටයිම් හා නිව්ස් වීක් සඟරාවල පිට කවරයේ සදාම් හුසෙන්ගේ නපුරු ජායාරූප පල කරන ලදි. මේ අවුරුද්දේ ස්ලොබොඩාන් මිලොසෙවික්ගේ ය. මීලඟ අවුරුද්දේ කාගේ ද? අලුත් ම ජාත්‍යන්තර දුෂ්ටයා යයි සීඑන්එන් මාධ්‍යය විසින් ප්‍රකාශ කෙරෙනු ඇති නව ශතවර්ෂයේ ප්‍රථම "හිට්ලර්" වන්නේ කවුද?

නැටෝ සංවිධානයේ සහයෝගී භාවය පිලිබඳ නිවේදනවලට වඩා බෙහෙවින් ම අර්ථභාරී වූයේ, යුගෝස්ලාවියාව යටත් වූ දිනයේ ම, යුරෝපීය රටවල් 15ක නායකයන් තමන් යුරෝපීය සංගමය ස්වාධීන යුද බලවතෙකු බවට ප්‍රතිවර්තනය කරන්නේ යයි කරන ලද ප්‍රකාශය ය. ඔවුහු නිල ප්‍රකාශයක මෙසේ සඳහන් කලාහ: "නැටෝ සංවිධානයේ ක්‍රියාකාරිත්වයට අගතියක් නො වන පරිද්දෙන්, ජාත්‍යන්තර අර්බුදයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා (යුරෝපීය) සංගමයට සැලකිය යුතු යුද හමුදා බලයක ආධාරය ඇතිව ස්වායත්තව ක්‍රියාකාරීවීමේ ධාරිතාව ද ඒවා පාවිච්චි කිරීමට තීන්දු කිරීමේ මාධ්‍යයන් ද, එසේ කිරීමේ සූදානමක් ද තිබිය යුතු ය." මෙම ප්‍රකාශයට යටින් ඇත්තේ යුරෝපීය ධනවාදයට එක්සත් ජනපදය සමග ලෝක පරිමානව තරග වැදීමේ -- එනම් පන රැක ගැනීමේ -- හැකියාව රැඳී පවත්නේ තමන්ගේ ම ජාත්‍යන්තර අවශ්‍යතා රැක ගැනීමට සමත් විශ්වසනීය මිලිටරි බලයක් තිබීම මත ය යන්න ය. භූ-දේශපාලන මූලෝපායික වාසි හා ආර්ථික උවමනාකම් දිනා ගැනීම සඳහා හමුදා බලය යෙදීමේ හැකියාව තිබිය යුත්තේ එක්සත් ජනපදයට පමනක් ය යන්න යුරෝපීය ධනේශ්වරයට කිසි සේත් ම ඉවසා ගත නො හැකි ය. මේ අනුව ප්‍රමුඛ අධිරාජ්‍යවාදී බලවතුන් අතර තරගය, යුගෝස්ලාවියාවට එරෙහි ප්‍රහාරයට වහාම

ඉක්බිත්තේ, විවෘත යුද්ධමය ස්වරූපයක් ගැනීමට දැන් මෑනි ඇත.

1999 බෝල්කන් යුද්ධය, අතිතයෙන් මානව හිතවාදී ලෙස බිඳී ගන්නවා වෙනුවට, අතීතයේ අතිශය පාපතර ලක්ෂනයන්ගෙන් එකක් වසංගතාකාරව යලි පැන නැගීම සලකුනු කරයි. එම ලක්ෂනය නම් මහ බලවතුන්ගේ මූලෝපායික අවශ්‍යතාවන්ට අනුව කුඩා රටවලට එරෙහිව ඉහවහ යන යුද්ධ බලය නග්න ලෙස පාවිච්චි කිරීම යුක්තිජාත කිරීම ය, ජාතික ස්වාධිපත්‍යය පිලිබඳ මූලධර්මය නරුම ලෙස උල්ලංඝනය කිරීම ය, විජිතකාරක යටත් කර ගැනීම් සැබැවින් ම යලි තහවුරු කර ලීම ය. නව ලෝක යුද්ධයක බීජයන් අන්තර්ගත කර ගත් විසි වන ශතවර්ෂය ආරම්භයේ දී පැන නැගී අධිරාජ්‍යවාදයේ යක්කු ජාත්‍යන්තර ධනේශ්වරය විසින් එලවා දමනු ලැබ නැත්තාහ. උහු විසිඑක් වන ශතවර්ෂයට ඇතුලත් වෙමින් සිටින මානව වර්ගයා පසුපස අවතාර සේ ලුහුබැඳ එති.

## යුගෝස්ලාවියාවට එරෙහි යුද්ධය සහ මාධ්‍යයෝ

සියලු ම යුද්ධවල දී ප්‍රචාරය තීරක ක්‍රියාකලාපයක් ඉටු කරයි. නාසි ප්‍රචාරක නායකයා වූ ජොසෙප් ගොබෙල්ස් වරක් මෙසේ කී ය: "පුවත් පත් වනාහි ආන්-වට කැමති ලෙස වාදනය කල හැකි වාද්‍ය යතුරුමාලාවක් යයි සිතා ගන්න" එහෙත් වත්මන් සමයේ ප්‍රචාරය අත් කර ගෙන ඇත්තේ, දෙවන ලෝක සංග්‍රාමය සමයේ දී සිතා ගැනීමට වත් නො හැකිව තිබූ පරිමාවකි, තාක්ෂනික තීව්‍රතාවකි, බලපෑමකි. වානිජ ප්‍රචාර හා විනෝද සම්පාදක කර්මාන්තයේ දී යොදා ගනු ලබන සිත් හිරිවට්ටන තාක්ෂනය එහි කෙල පැමිනි ප්‍රකාශනය අත් කර ගන්නේ මහා ශ්‍රාවකයකට යුද්ධය "අලෙවි කිරීමේ දී ය". මෙම මුලුමහත් කාලකන්නි දුෂ්ප්‍රයත්නය රැඳී පවත්නේ, මහජනතාව අවමංගත කිරීමට සරල ලෙස යොදා ගත හැකි කුමක් හෝ හැඟීම් බර තනි පාඨයක් මත ය. 1998-1999 ඉරාකයට විරුද්ධව බෝම්බ ප්‍රහාරයේ දී යොදා ගන්නා ලද වාක්‍යය නම්: "මහා විනාශයේ අවි" යන්නයි. යුගෝස්ලාවියාවට එරෙහි ප්‍රහාරය පිටුපස මහජන මතය බලමුලුගැන්වීම සඳහා බෝල්කන් ප්‍රදේශයේ සියලු ම ප්‍රතිඝතිතතා, සංකීර්නතා පැහැදිලිකම් දවස් පතා වමාරා කන ලද තනි වාක්‍යයකට සිඳවන ලද්දේ ය: "ජනවාර්ගික සුද්දය". ඇමරිකානු හා ජාත්‍යන්තර මහජනතාව තොරතෝංචියක් නැතිව එකම නිර්දය පනිවිඩයට ගොදුරු කරන ලදි: යුද්ධය කර ගෙන යන්නේ මහා සංහාරයක් වැලැක්වීමට ය. තමන්ට පෙන් වූ දේ පිලිබඳව ප්‍රේක්ෂකයන් මුලුමනින් ම නො දැනුවත් ව තබන පරිද්දෙන් ඓතිහාසික හා දේශපාලන සන්දර්භයෙන් වෙන් කොට කොසොවෝවෙන් පිටාර ගලන ඇල්බේනියානු ජනවාර්ගික සරනාගතයන්ගේ වීඩියෝ පින්තූර ප්‍රචාරය කරන ලදි. බෝම්බ හෙලීම අරඹන තෙක්, අ-ගනනේ ලෝකයේ වෙනත් ප්‍රදේශවල සිදුවෙමින් පැවතුනු ප්‍රජාගන ගැටුම් හා සමකර බලන කල්හි කොසොවෝවේ නැති වූ ජන ජිවිත සාපේක්ෂව අ- වූ බව සරලව ම නො තකා හරින ලදි. සර්බ් මිලිටරි හා අර්ධ මිලිටරි බලකායයන් විසින් ඍජුව මරා දමන ලද සැබෑ කොසොවෝ ඇල්බේනියානු ජන සංඛ්‍යාව 100,000 හෝ 250,000ක් තරම් යයි කියන ලද එක්සත් ජනපද රාජ්‍ය හා නැටෝ කතිකයන්ගේ වියරු කියාපෑම් ඔප්පු කිරීමට කිසිසේත් ම සාධක නො දක්වන ලද අතර එම සංඛ්‍යාවල යථාර්ථයට මොනම සම්බන්ධයක් හෝ තිබුනේ ද නැත.

කොසොවෝව සහ හොලෝකෝස්ටය (හිට්ලර්ගේ යුදෙව් සංහාරක මහා වන්නිය) අතර කරන ලද සංසන්දනය කුනුහරුපයකි. සර්බියාව නාසි ජර්මනියට සම කිරීම සරලව ම විකාරයක් විය. ලෝක උසාවිය මිලොසෙවික්ට එරෙහිව දේශපාලන චේතනාවෙන් යුතු චෝදනාවේ අන්තිමේ දී සඳහන් වූ පරිදි, ඔහු නිල වසයෙන් වගකිව යුතු යයි පෙන්නුම් කරන ලද මරන සංඛ්‍යාව 391ක් විය. මිලොසෙවික් මානව භක්තිවාදියෙක් යයි කවරෙක් හෝ තර්ක කරනු නැත. එහෙත් ඔහුට වඩා මරනවලට වගකිව යුතු තව බොහෝ දෙනෙක් සිටිති; ඔවුනතර නෝබෙල් සාම ත්‍යාග ලත් ඇමරිකාවේ ම හෙන්රි කිසිංගර් ද වෙයි. එහිම දරිද්‍රතාවයේ ද තකතිරුභාවයේ ද බරින් මේ මුලු මහත් ප්‍රචාරක ව්‍යායාමයම බිඳ වැටෙන තැනට ආවේ ය. එහෙත්, ක්ලින්ටන් පාලනය විසින් ඉදිරිපත් කරන ලද නිල මානව හිතවාදී කියාපෑම් හැර යුද්ධයට වෙනත් හේතු තිබුනු බව, ඇමරිකානු ජනමාධ්‍යයන්හි යුගෝස්ලාවියාවට බෝම්බ දැමීමට ගත් තීන්දුව ඉතාම බියගුලු පදවලින් වුව හෙලා දුටු අය පවා, කවර කලෙක වත් පිලිගත්තේ නැත.

ගැටුමේ ඓතිහාසික පසුබිම පරීක්ෂා කිරීමට මාධ්‍යයෝ මොන ම උත්සාහයක් වත් නො දැරූහ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් යුගෝස්ලාවියාව මත පටවන ලද ආර්ථික පිලිවෙත් සහ ප්‍රජාගන ආතතීන් යලි ඉස්මතුව ඒම වැනි තීරනාත්මක ප්‍රශ්න පරීක්ෂා කිරීමට ජනමාධ්‍ය කිසි ම උත්සාහයක් දරුවේ නැත. 1990 ගනන්වල ඇමරිකානු හා ජර්මානු පිලිවෙත් විසින් මෙයට කරන ලද විනාශකාරී ප්‍රතිපදානය -- නිශ්චිත වසයෙන් ගත් කල්හි ස්ලෝවීනියානු, ක්‍රෝඒසියානු සහ බොස්නියානු ස්වාධීනතාව පිලිගැනීම -- ගැන මොන ම සත්‍ය_හෝ විවේචනාත්මක විචාරයක් වත් කරන ලද්දේ නැත. 1918 සිට පැවති රාජ්‍යයක් වූ සර්බියාව ඉරා දැමීම නිසා ඇති වූ දේශපාලන හා ආර්ථික විපාක ගැන අතෘප්තිමත් වීමට සර්බ්වරුන්ට මොනයම් මැ හෝ හේතුවක් තිබුනේ ද යන්න -- අ- ගනනේ මතු කරන ලද්දේ වත් නැත. එක් අතකින් ක්‍රෝඒසියාවේ, ස්ලොවීනියාවේ සහ බොස්නියාවේ භෞමික අයිති දැක්වීම් ද, ජනවාර්ගික පිලිවෙත් ද කෙරේ තමන්ගේ ආකල්පය සහ අනෙක් අතට සර්බියාවේ එවන් කටයුතු කෙරේ තමන්ගේ ආකල්පය අතර පැවති කැපී පෙනෙන වෙනස පිලිබඳ ව එක්සත් ජනපදය සහ බටහිර යුරෝපීය බලවතුන් විසින් මොන ම පැහැදිලි කිරීමක් වත් කරන ලද්දේ නැත. උදාහරනයක් හැටියට එක්සත් ජනපදය 1995 දී ක්‍රෝඒසියාව, ක්‍රැජිනා ප්‍රදේශයේ ජිවත් වූ සර්බ් ජාතිකයන් 250,000ක් එලවා දමමින් කල "ජනවාර්ගික සුද්දයට" ඔවුන් ක්‍රියාත්මක සහයෝගය දුන්නේ මන් ද? මොන ම උත්තරයක් වත් නැත.

සාමාන්‍ය රීතියක් හැටියට ගත් කල්හි, සර්බ් ආන්-වේ ක්‍රියාවලට ඉතා සුලු යුක්තිසහගත භාවයක් හෝ ලබා දුන් සියලු තොරතුරු ජනමාධ්‍යයන් විසින් යටපත් කර දමන ලදි. දැනුවත් මුසාකරනයේ ඉතා අපකීර්තිමත් උදාහරනය නම් රම්බුයියේ සිදු වූ දේ පිලිබඳව ජනමාධ්‍යයන් දැරූ ආකල්පය යි. ප්‍රථමයෙන් ම එය, නිරතුරුව ම රම්බුයියේ ගිවිසුම සර්බ්වරුන් විසින් ප්‍රතික්ෂේප කිරීම ගැන සඳහන් කලේ ය. එසේ

කරන ලද්දේ රම්බුයියේහි දී සාකච්ඡා හෝ ගිවිසුමක් ඇති නො වූ බව එහි සිදු වූ දේ දන්නා අය මැනවින් වටහාගෙන ඇති බව ද නො තකමිනි. සර්බිවරුන් ප්‍රතික්ෂේප කලේ කේවෙල් කිරීමට ඉඩ නො තැබූ අවසාන නිවේදනයකි.

වඩාත් වංචනික වූයේ, ඇමරිකානු හා බටහිර යුරෝපීය ජනමාධ්‍ය, යුගෝස්ලාවියාවට එරෙහි ප්‍රහාරය විරුද්ධ මහජන මතයට බලපා හැකි තීරනාත්මක තොරතුරු වසන් කිරීම ය. මෙම "ගිවිසුම" නැටෝ හමුදාවලට කොසොවෝ හරහා පමනක් නො ව යුගෝස්ලාවියාවේ සියලු ම ප්‍රදේශ හරහා ගමන් කිරීමට හැකි බවට සර්බිවරුන් එකඟ විය යුතු ය යන උපලේඛනයක් ද අමුනන ලද බව ජනමාධ්‍ය විසින් සරලව ම විස්තර නො කර අතහැර දමන ලදි. මෙම වගන්තියේ අර්ථභාරය ඉතා පැහැදිලි විය. එකඟ විය නො හැකි බව හොඳින් පැහැදිලි වූ අවසාන නිවේදනයක් එක්සත් ජනපදය මිලොසෙවික්ට ඉදිරිපත් කලේ ය. මෙම තොරතුරු අන්තර් ජාලය හරහා ගලා ආ පසුව ද, ජනමාධ්‍ය විසින් නො තකා හරින ලදි. *නිව් යෝක් ටයිම්ස්* පුවත් පත අන්තිමේ දී ඉහත සඳහන් තීරනාත්මක වගන්තිය පල කලේ හා උපුටා දැක්වීමක් පවා පල කලේ ජූනි 5 දින සර්බියාව යටත් වූ පසුව පල කරන ලද මුද්‍රනයේ ය. කොසොවෝවෙන් සර්බි හමුදා ඉවත් කර ගැනීමට මිලොසෙවික් එකඟ කර ගැනීමේ දී, මිලොසෙවික් හමුවීමට ගිය (රුසියානු නියෝජිත) චර්නොඩිමින් ද, නැටෝ නියෝජිත අහ්ටිසාරි ද ඉහත සඳහන් විශේෂ වගන්තිය ඉවත් කර ගැනීම තීරනාත්මක සාධකයක් වූ බව *නිව් යෝක් ටයිම්ස්* පුවත් පත පිලිගත්තේ ය.

## අධිරාජ්‍යවාදය සහ බෝල්කන්

ජනමාධ්‍ය "ජනවාර්ගික සුද්දය" පිලිබඳ තේමාවට තමන්ගේ ඒකෝන්මාදී එල්බගැනීම උග්‍ර වූ තරමට, එය යුගෝස්ලාවියාවට එරෙහි තම ප්‍රහාරය දියත් කිරීමට ක්ලින්ටන් පාලනය ගත් තීන්දුවට සාධක වූ වඩාත් බරපතල හා සාරභූත හේතු පරීක්ෂා කිරීමට හරස් වූවක් ලෙස මතු විය. අවාසනාවකට මෙන්, බෝල්කන් ඉතිහාසය පිලිබඳව ද ජාත්‍යන්තර දේශපාලනය පිලිබඳව ද විශේෂඥ වූ එක්සත් ජනපද ශාස්ත්‍රීය විශේෂඥයෝ, ගරු කටයුතු කීපදෙනෙකු හැර අන් අය, එම ප්‍රචාරක ව්‍යායාමයට ප්‍රසිද්ධියේ අභියෝග කිරීමට කැමැත්තක් නො දැක්වූහ. සත්තකින් ම ඔවුහු, බෝල්කන් ප්‍රදේශය තුල අර්ථභාරී භෞතික අවශ්‍යතාවලට ඔට්ටු අල්ලා ඇති බව ගැන කරන ලද මොනයම් මැ යෝජනාවක් හෝ ප්‍රතික්ෂේප කිරීම මගින්, ඇමරිකානු පාලනයේ මානව භක්තිවාදී ඉරියව්වලට යම් ප්‍රමානයක බුද්ධිමත් විශ්වසනීය බවක් අත් කර දුන්හ.

මෙම ප්‍රදේශය පිලිබඳ උඩින් මත්තෙන් කෙරෙන අධ්‍යයනයක් වුව, මෙය සාවද්‍ය බව පෙන්නුම් කරයි. කොසොවෝවේ අලෙවි කල හැකි සම්පත් බහුල ය. ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ස්ථම්භය වූ *නිව් යෝක් ටයිම්ස්* පුවත් පත 1999 ජූනි 2 දා පහත සඳහන් මැයින් යුතු ලිපියක් පල කලේ ය: "ත්‍යාගය: කොසොවෝවේ පෝසත් පතල් පාලනය කරන්නේ කවුද?" යනුවෙන් ඇරඹුනු එහි මෙසේ සඳහන් විය:

"කොසොවෝ සඳහා නිල නො වන බෙදුම් සැලසුම් ගනනාවක් ම සකසා ඇත. ඒ සියල්ල ම උතුරේ වැදගත් නිල පාලනය කරන්නේ කවුරුන්ද යන ප්‍රශ්නය මතු කරයි. බෝම්බ දැමීම නිසා අලුත් ම නිෂ්පාදන සංඛ්‍යා ලේඛන ලබා ගැනීම දුෂ්කර වී ඇත. විශේෂඥයන් කියන්නේ මෙම සම්පත්වලට ගල්අඟුරු ද නිකල්, රයම්, තුත්තනාගම් සහ වෙනත් ඛනිජ ප්‍රමානයක් ද ඇතුලත් වන බව ය."

එහෙත් මෙවන් සම්පත් තිබීම ම යුද්ධයට සෑහෙන හේතුවක් යයි සැලකිය නො හැකි ය. ඉලක්කය වූ රට තුල යම් අමුද්‍රව්‍ය ප්‍රමානයක් තිබේ ය යන කාරනය පමනක් යුද්ධයක් දියත් කිරීමට හේතු වේ ය යන්න වනාහි සංකීර්න මූලෝපායික විචල්‍යයන් උවමනාවට වඩා සරල කිරීමක් වනු ඇත. කෙසේ වෙතත් ඒ හෝ මේ රටට හෝ සංගතයට ක්ෂනික මූල්‍ය වාසි ලබාදීමට වැඩි අර්ථයක් භෞතික අවශ්‍යතාවන් පිලිබඳ සංකල්පයට අන්තර්ගත වේ. අධිරාජ්‍යවාදී රටවල මූල්‍ය හා කාර්මික ප්‍රභූස්ථර තමන්ගේ ද්‍රව්‍යමය අවශ්‍යතා නීර්නය කර ගන්නේ ජාත්‍යන්තර භූ-දේශපාලනික ගනන් බැලීම්වල රාමුව තුල ය. උදුරා ගත හැකි සම්පත් සම්බන්ධයෙන් ගත් කල්හි කිසිදු ආවේනික වටිනාකමක් නැති නිස්සාර ඉඩම් පටියක් වුව ද භූගෝලීය පිහිටීම නිසා හෝ එසේත් නැති නම්, ජාත්‍යන්තර දේශපාලන සම්බන්ධතා හා බැඳීම් උඩ වෙනස් වන සාධක නිසා හෝ නො මිනිය හැකි වටිනාකමකින් යුතු මූලෝපායික වත්කමක් ලෙස දැක ගනු ලබන තත්වයක් උද්ගත විය හැකි ය. බොහෝ දුරට තනි ගල් පර්වතයකින් යුතු ජිබ්‍රෝල්ටා දිවයින හරියට ම අන්න ඒ වර්ගයේ වත්කමකි. මෙවන් අත්‍යසාමාන්‍ය ආවේනික වටිනාකමකින් යුතු වෙනත් ප්‍රදේශ ඇත -- විශේෂයෙන් ම පර්සියන් වරාය -- මේවා රැක ගෙන පාලනය කිරීමට අධිරාජ්‍ය බලවතුන් ඕනෑම දෙයක් කරනු ඇත.

බෝල්කන් ප්‍රදේශය මහ තෙල් සාගරයක පාවෙන්නක් නො වේ; එය නිස්සාර මු- බිමක් ද නො වේ. එහෙත් එම ප්‍රදේශයේ මූලෝපායික වැදගත්කම අධිරාජ්‍ය බල දේශපාලනයේ ස්ථාවර සාධකයකි. එහි භූගෝලීය පිහිටීම නිසා පමනක් වුව ද එක්කෝ බටහිර යුරෝපයට නැගෙනහිර කරා ගමන් කිරීමේ තීරනාත්මක මධ්‍යස්ථානයක් ලෙස, නැතහොත් රුසියාවේ හා පසුව සෝවියට් සංගමයේ ප්‍රසාරනයට එරෙහි බෆරයක් ලෙස, බෝල්කන් ප්‍රදේශය ජාත්‍යන්තර බලතුලනයේ ලා තීරක ක්‍රියාකලාපයක් ඉටු කලේ ය. බෝල්කන් ප්‍රදේශයේ සිද්ධීන් පලමු වන ලෝක යුද්ධය පුපුරා යාමට තු- දුන්නේ, 1914 ජූලි මාසයේ දී ඕස්ත්‍රියා-හන්ගේරියාව විසින් සර්බියාවට දෙන ලද අන්තිම නිවේදනය (ඉන් අවුරුදු 85කට පසු එක්සත් ජනපදය හා නැටෝව විසින් දෙන ලද අන්තිම නිවේදනයට තරමක් සම වූ) ප්‍රධාන යුරෝපීය රාජ්‍යයන් අතර අඩමාන බලතුලනය අස්ථාවර කිරීමට තර්ජනය කල හෙයිනි.

විසි වන සියවස පුරා ම එක්සත් ජනපද බෝල්කන් ප්‍රදේශය කෙරේ දැක්වූ ආකල්පය පලල් ජාත්‍යන්තර උත්සුකතා විසින් නීර්නය කරනු ලැබ ඇත. ප්‍රථම ලෝක යුද්ධ සමයේ ජාතීන්ගේ ස්වයං-නීර්නය ආරක්ෂා කිරීමට ජනාධිපති වුඩ්රෝ විල්සන් ගත් තීන්දුව එක්තරා දුරකට ප්‍රේරනය වූයේ ඕස්ට්‍රෝ-හන්ගේරියන්

අධිරාජ්‍යයට එරෙහිව බෝල්කන් ජනතාවගේ ජාතික අවශ්‍යතා ප්‍රයෝජනයට ගැනීම පිලිබඳ චේතනාවෙනි. ලෝක යුද්ධය අවසන් කිරීමේ ගිවිසුමට පාදක වන ලෙස විල්සන් විසින් ඉදිරිපත් කරන ලද සුප්‍රකට "කරුනු 14න්" එකක් නම්, සර්බියාවට මුහුදට පිවිසීමේ අයිතිය ද ලබා දී ශක්තිමත් කිරීම ය. (අද මොන්ටිනිග්‍රෝ ප්‍රාන්තය යුගෝස්ලාවියාවෙන් වෙන් කිරීමට දිරි දීම මගින් එක්සත් ජනපදය උත්සුකව සිටින්නේ සමුද්‍රයට පිවිසීමේ මෙම අයිතිය සර්බියාවට අහෝසි කිරීමට ය.) දෙවන ලෝක යුද්ධයෙන් පසු බෙල්ග්‍රේඩ්හි මාෂල් ටිටෝ නායකත්වය දුන් නව පාලන තන්ත්‍රය කෙරේ එක්සත් ජනපද පිලිවෙත තින්දු කිරීමේ දී තීරනාත්මක සාධකය වූයේ සෝවියට් සංගමය සමග ඝට්ටනය ගැඹුරුවීම ය. 1948 දී ස්ටැලින් හා ටිටෝ අතර කටුක ගැටුමක් පුපුරා යාම, යුගෝස්ලාවියාව ලෝක සිද්ධීන් තුල ඉටු කල ක්‍රියාකලාපය පිලිබඳ වොෂිංටනයේ තක්සේරුව මත නාටකීය බලපෑමක් ඇති කලේ ය. අද්‍රියාතික් මුහුද හරහා මධ්‍යධරනී මුහුදට ද (එමගින් දකුනු යුරෝපයට සහ මැද පෙරදිගට ද) සෝවියට් ප්‍රසාරනයට බාධාවක් ලෙස ටිටෝ පාලනය දැක ගත් එක්සත් ජනපදය, යුගෝස්ලාවියාවේ ඒකීයත්වයේ ද භෞමික අඛන්ඩතාවයේ ද අධිකෂිකෂීන සහගත ආරක්ෂකයෙකු බවට පත් විය.

සෝවියට් සංගමය විසුරුවා හැරීම බෙල්ග්‍රේඩය සමග වොෂිංටනයේ සබඳතා මාරු කලේ ය. සෝවියට් සංගමය ප්‍රසාරනය වීමේ අවතාරය නැති කල, ඒකාබද්ධ යුගෝස්ලාව් රාජ්‍යයක් පවත්වාගෙන යාමට තව දුරටත් කැපවීම අවශ්‍ය නැතැයි එක්සත් ජනපදය කල්පනා කලේ ය. යුගෝස්ලාවියාව කෙරේ නව ඇමරිකානු පිලිවෙත පිලිබිඹු කලේ, පැවති සෝවියට් සංගමයේ ද පැරනි නැගෙනහිර යුරෝපීය ස්ටැලින්වාදී තන්ත්‍රිය රටවල ද ආර්ථිකයන් ධනේශ්වර වෙලඳ පොල මූලධර්ම මත, වේගයෙන් ප්‍රතිසංවිධානය කිරීමට සම්බන්ධ වූ නව උත්සුකයන් මාලාවක් ය. මුල දී යම් දෙගිඩියාවකින් පසුව ඇමරිකානු ප්‍රතිපත්ති සම්පාදකයෝ, සෝවියට් ස්වරූප නිලධර පාලිත ආර්ථිකයන් තුල එතරම් මැ ක්‍රියාකලාපයක් ඉටු කලා වූ පැරනි මධ්‍යගත රාජ්‍ය ව්‍යූහයන් බිඳ දැමීම මගින් ආර්ථික ජනසතුහරනයේ හා බටහිර ප්‍රාග්ධනය කාවැදීමේ සන්තතිය, වඩාත් පහසු වනු ඇතැයි යන මතය පිලිගත්හ. එක්සත් ජනපදය ද එහි බටහිර යුරෝපීය සගයෝ ද ඉක්බිති ඒකීය යුගෝස්ලාව් සන්ධීය රාජ්‍යය (ෆෙඩරල් රාජ්‍යය) කැබලිති කිරීමේ කටයුත්ත මෙහෙයවීමට වැඩ කලහ. මෙය කරන ලද්දේ සරලව ම පැරනි සන්ධීය රාජ්‍යයේ සමූහාන්- -– ස්ලෝවීනියාවෙන් හා ක්‍රෝඒසියාවෙන් අරඹා ඉක්බිති බොස්නියාව දක්වා -– ස්වාධීන ස්වාධිකාරී විය. බෝල්කන් ප්‍රදේශය පිලිබඳ ප්‍රමුඛ විශේෂඥයකු වූ මහාචාර්ය රාජු ජී.සී. තෝමස් පෙන්වා දුන් පරිදි:

"ස්ලෝවීනියාව සහ ක්‍රෝඒසියාව විසින් ඒකපාක්ෂික ව ස්වාධීනතාව ප්‍රකාශ කිරීමට ද ඉක්බිති ජර්මනිය විසින් ද ඊට පසු වතිකානුව, සෙසු යුරෝපීය රටවල් සහ එක්සත් ජනපදය විසින් ද ඒවා පිලිගැනීමට පෙර යුගෝස්ලාවියාවේ මහා ජනඝාතන සිදුවූයේ නැත. බොස්නියාව පිලිගැනීමට පෙර එරටේ ද මහාඝාතන සිදු වූයේ නැත. පැරනි යුගෝස්ලාව් රාජ්‍යය ආරක්ෂා කිරීම සියල්ලෙන් අ- නපුර විය හැකිව තිබුනි. ගැටලු පැන නැගුනේ මෙම ප්‍රදේශ රාජ්‍ය ලෙස පිලිගැනීම හෝ පිලිගත යුතු යයි බලපෑම හෝ සිදු වූ කල්හි ය. පැරනි යුගෝස්ලාවියාව තමන්ගේ අසල්වැසි රාජ්‍ය මත ආක්‍රමන සිදු කර තිබුනේ ද නැත. එහෙයින් සත්තකින් ම යුගෝස්ලාවියාවේ සැබෑ ආක්‍රමනය ඇරඹුනේ බටහිර රටවල් ස්ලෝවීනියාව හා ක්‍රෝඒසියාව පිලිගැනීමත් සමග ය. ස්වෙච්ඡාවෙන් ම නිර්මානය කරනු ලැබුවා වූ ද, 1918 සිට පැවති තිබුනා වූ ද රාජ්‍යයක භෞමික අඛන්ඩතාව පසෙකට අතුගා දමන ලදි. 1991 දී නව රාජ්‍ය පිලිගැනීම කලක් තිස්සේ පැවති ස්වෛරී ස්වාධීන රාජ්‍ය විනාශ කර දැමීමේ පිලිවෙතක් සම්පාදනය කලේ ය. පෝසත් සහ බලගතු රාජ්‍ය ගනනාවක් පිලිගැනීමේ පිලිවෙත මගින් ස්වෛරිය ස්වාධීන රාජ්‍යයක් කැබැලි කර ඉරා දැමීමට තින්දු කල කල්හි, එම රාජ්‍යය ආරක්ෂා වී යන්නේ කෙසේ ද? ජාත්‍යන්තර රාජ්‍ය විනාශ කිරීමේ මෙම ක්‍රමය වැලැක්වීමට හෝ ඉන් ආරක්ෂාවීමට ක්‍රමයක් ඇත්තේ නැත. සත්තකින් ම, ජර්මනිය විසින් ද පසුව එක්සත් ජනපදය විසින් නායකත්වය දෙනු ලැබූ බටහිර රටවල් යොදා ගත් රාජ්‍ය පිලිගැනීමේ පිලිවෙත මගින් යුගෝස්ලාවියාව කැබැලි ගලවා දමන ලදි."1

සෝවියට් සංගමය විසුරුවා හැරීමෙන් ගලා ආ ජාත්‍යන්තර මූලෝපායික ගම්‍යයෝ එක්සත් ජනපදයට ද නැටෝවට ද පැරනි යුගෝලාවියාව කැබැලි කිරීම උසිගැන්වීමට තවත් හේතුවක් සපයා දුන්නේ ය. සෝවියට් සංගමය බිඳ වැටීමෙන් නිර්මානය කරන ලද බල රික්තය තම ප්‍රයෝජනයට යොදා ගෙන, තම බලය තවත් නැගෙනහිරට විහිදුවා, පැරනි සෝවියට් සංගමය අයත්ව තිබුනු මධ්‍ය ආසියාවේ අලුතෙන් ස්වාධීන වූ රාජ්‍යයන්ගේ මෙතෙක් අත නො තබන ලද තෙල් සහ ස්වාභාවික ගෑස් නිධි තම පාලනයට ගැනීමට එක්සත් ජනපදය උත්සුක විය. මෙම නව භූ-දේශපාලනය වතාවරන තුල, බෝල්කන් ප්‍රදේශ, විශේෂයෙන් එක්සත් ජනපදයේ අධිරාජ්‍යවාදී බලය මධ්‍යම ආසියාවට ප්‍රක්ෂේපනය කිරීම සඳහා ප්‍රානභූත වැදගත්කමක් දරන්නා වූ සේනා-ද්‍රව්‍ය සම්පාදක භූමියක් ලෙස සුවිශේෂ මූලෝපායික වැදගත්කමක් දරයි. ඇමරිකා එක්සත් ජනපදය ද මිලොසෙවික්ගේ පාලන තන්ත්‍රය ද අතර ගැටුමේ අවසාන උල්පත පැවත්තේ මෙහි ය. සත්තකින් ම යුගෝස්ලාවියාවේ වෙලඳ පොල ආර්ථිකයක් පිහිටුවීමට හෝ අධිරාජ්‍යවාදීන් සමග එක්ව වැඩ කිරීමේ පිලිවෙලක් තනා ගැනීමට හෝ මිලොසෙවික් සත්තකින් ම විරුද්ධ වූයේ නැත. එහෙත් යුගෝස්ලාවියානු සන්ධීය රාජ්‍යය විසුරුවා හැරීම මිලොසෙවික්ගේ මුල් ගනන් බැලීම්වලට ප්‍රතිවිරුද්ධව සර්බියාවට අවාසි ආකාරයට කටයුතු සිද්ධ කලේ ය.

බෝල්කන් ප්‍රදේශයේ අධිරාජ්‍යවාදී පිලිවෙත් සර්බියාව දුබල කර පැරනි සන්ධීය රාජ්‍යයේ විවිධ ප්‍රදේශවල ජීවත් වූ මුලුමහත් සර්බියන් ප්‍රජාව අනතුරට පත් කලා වූ වංචනික දෙබඩි බවින් ඉහවහ ගිය පිලිවෙතක් වූ බව වටහා ගැනීම සඳහා මිලොසෙවික්ගේ ක්‍රියාමාර්ගයට අනුග්‍රහ දැක්වීමක් අවශ්‍ය වන්නේ නැත. "ජනවාර්ගික සුද්දය" ලෙස පසු කලෙක හඳුන්වනු ලැබූ දෙය ඇතුලත් කරගත් ක්‍රෝඒසියායානු හා බොස්නියානු මුස්ලිම් හමුදාවල කටයුතු, පලල් වසයෙන් ජාතික ආත්ම-ආරක්ෂාවේ යුක්තියුක්ති පියවර ලෙස බොහෝ දුරට දක්නා ලද අතර, සර්බි ජාතිකයන්ගේ එවන් ක්‍රියාවන් නො ඉවසිය හැකි ලෙස ජාත්‍යන්තර පර්යාය උල්ලංඝනය කිරීමක් ලෙස හෙලා දකිනු ලැබිනි. යුගොස්ලාවියාව විසුරුවා හැරීමේ තර්කනය, සර්බියාව නව රාජ්‍ය පද්ධතිය

තුල තම ජාතික අවශ්‍යතා ආරක්ෂා කර ගැනීමට ගත් සෑම පියවරකට ම අපරාධකාරී බවක් අත්කර දුනි. ස්ලොවීනියාව, ක්‍රෝඒෂියාව සහ බොස්නියාව අධිරාජ්‍යවාදීන් විසින් පිලිගැනීම, යුගෝස්ලාවි හමුදාව අධිරාජ්‍යවාදී ජාත්‍යන්තර ප්‍රජාවගේ ඇස් ඉදිරියේ, නව ස්වාධීන රාජ්‍යයන්හි ස්වාධීනත්වයට හා ස්වෛරීයත්වයට තර්ජනය කල ආක්‍රමනිකයෙකු බවට පත් කලේ ය. පැරනි සන්ධීය රාජ්‍යයේ ඉතිරිව තිබුනු ප්‍රදේශයේ සීමාවෙන් පිට සිටි සර්බ් සුලුතරයේ කටයුතු එසේ ම යුගෝස්ලාවි ආක්‍රමනික කටයුතු ලෙස දැක ගන්නා ලදි. බෝල්කන් අර්ධද්වීපය කුට්ටි කිරීමේ විපාක ගැන සර්බියානු අතෘප්තිය ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මූලෝපායික ඉලක්කයන්ට බාධාකාරී වූ තාක් දුරට එය වොෂිංටනයේ උදහස අවුලුවා සර්බියාවට අමතක නොවන පාඩමක් උගැන්විය යුතුය යන නිගමනයට තුදුන්නේ ය.

## එ.ජ. අධිරාජ්‍යවාදයේ භූගෝලීය ප්‍රසාරනය සහ දෙවන "ඇමරිකානු ශතවර්ෂය"

යුගෝස්ලාවියාවට එරෙහි ප්‍රහාරය දියත්කරනු ලැබුවේ නැටෝ සංවිධානයේ ඒකාබද්ධ හමුදා විසිනි. එහෙත් සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම අතින් යුද්ධය ඇමරිකානු ව්‍යායාමයක් විය. ටෝනි බ්ලෙයාර් අගමැති, තරමක් විහිලු සහගත ලෙස මාගරට් තැචර් අනුකරනය කිරීමට දරන ලද ප්‍රයත්නය පවා, එක්සත් ජනපදය අතිශය වාචික අර්ථයකින්, මෙම යුද්ධයේ දී අන දෙන්නා වී ය යන්න වසන් කිරීමට අසමත් විය. මාර්තු 24 දින ප්‍රථම කෲස් මිසයිලය යුගෝස්ලාවියාවට එරෙහිව දියත් කිරීම, අවුරුද්දකට අ- කාලයක් තුල දී එක්සත් ජනපදය විදේශීය රටකට එරෙහිව බෝම්බ දැමූ හතර වන වතාව සලකුනු කලේ ය. මේ අවුරුද්දේ ම මීට කලින් සදාම් හුසේන්ගේ "මහා විනාශකාරී අවි" යයි කියන ලද අවතාරයට විරුද්ධව ක්ලින්ටන් පාලනය ඉරාකය මත්තේ රෞද්‍ර බෝම්බ ව්‍යායාමයක් ඇරඹී ය. දැන් ඉරාකයට බෝම්බ දැමීම ඇමරිකානු විදේශ පිලිවෙතේ නව ස්ථාවර හා නිරන්තර ලක්ෂනයක් බවට පත්ව ඇත. ඕනෑම වෛෂයික නිර්නායකයක් අනුව ගතහොත් පසුගිය දස වසරක ඇමරිකානු යුද්ධමය කටයුතුවල වාර්තාව විශ්මය ද භයංකාරත්වය ද දනවයි. සාමයට ඇති තමන්ගේ කැමැත්ත වමනය වන තෙක් අප්පිරියා වන පරිදි කියාපාන්නා වූ රටක් මෙම අවුරුදු 10 ඇතුලත නිරන්තරව ම මෙන් තම දේශසීමාවට පිටතින් ඒ හෝ මේ යුද්ධ අභ්‍යාසයක යෙදී සිට ඇත. ගොඩබිම ප්‍රහාර සහ හෝ බෝම්බ හෙලීම ඇතුලත් කරගත් මහ ආක්‍රමන හයකට වඩා ඒ රට විසින් සිදුකර ඇත. පැනමා (1989), පර්සියානු බොක්ක (1990-91), සෝමාලියාව (1992-93), බොස්නියාව (1995), පර්සියන් බොක්ක II (1999), කොසොවෝ-යුගෝස්ලාවියාව (1999). මීට අමතරව ආක්‍රමනය කර යටත් කර ගැනීමේ මාලාවක් සිදු කරන ලදි. හයිටි (1994), බොස්නියා (1995) සහ මැසිඩෝනියාව (1995). පසුගිය දශකය තුල කෙලින් ම හෝ වක්‍රව ඇමරිකානු යුද්ධ ක්‍රියා නිසා විනාශ වූ මිනිස් ජීවිත සංඛ්‍යාව ලක්ෂ ගනනකි. ස්වභාවයෙන් ම, ඇමරිකානු ආන්-ව ද ප්‍රවෘත්ති මාධ්‍ය ද විසින් මේ එක් එක් සිද්ධියක් ඉදිරිපත් කරනු ලැබුවේ යහගුනකාමී සාම සාධනයක් ලෙස ය. ඒවා සැබැවින් ම ඇමරිකානු අධිරාජ්‍යවාදයේ එන්නඑන්න ම උග්‍රවන යුද්ධවාදී ස්වභාවයේ වෛෂයික ප්‍රකාශනයෝ ය.

සෝවියට් සංගමයේ බිඳවැටීම ද එක්සත් ජනපදය 1990 ගනන්වලින් පසුව තම අන්තර් ජාතික න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කල ආක්‍රමනික හා මූර්ග ආකාරය ද අතර නැතැයි කිව නො හැකි හා පැහැදිලි සම්බන්ධතාවක් පවති. ඇමරිකානු පාලක ප්‍රභූස්ථරයේ විශාල කොටසක් එක්සත් ජනපදයට ප්‍රතිරෝධය දැක්වීමට සමත් සැලකිය යුතු ජාත්‍යන්තර සතුරෙකු නො සිටීම මිලිටරි බලය යොදාගැනීම මගින් තම භූගෝලීය ආධිපත්‍යයේ අනභියෝගී තත්වයක් නිර්මානය කර ගැනීමට ඓතිහාසික වසයෙන් පෙර නුවූ විරූ අවස්ථාවක් ලබා දෙතැයි ඒත්තු ගෙන සිටිති. "ඇමරිකානු ශතවර්ෂයක්" පිලිබඳ ව දෙවන ලෝක යුද්ධයෙන් පසුව දක්නා ලද සිහිනය, සෝවියට් සංගමයේ පැවත්ම විසින් ඇමරිකානු විජිගීෂාවට දමන ලද සීමාවන් නිසා බිඳ වැටුනු නමුත් වොෂිංටනයේ ප්‍රතිපත්ති සකසන්නන් ද, රට පුරාම චින්තන තටාකයන් ද තර්ක කරන්නේ දැන් ඇමරිකාව සතුව පවත්නා ඉහවහා යන මිලිටරි ආධිපත්‍යය 21 වන ශතවර්ෂය එරටට අත් කර දෙනු ඇතැයි කියා ය.

බාහිර බාධාවන් සහ සැලකිය යුතු අභ්‍යන්තර විරෝධතාවක් නැති කල්හි, එක්සත් ජනපදයේ කර්තව්‍යය විය යුත්තේ වෙලඳ පොල මූලධර්ම මත ඇමරිකානු අන්තර් ජාතික සංගත විසින් අර්ථකථනය කරනු ලැබූ ද පාලනය කරනු ලැබූ ද ආකාරයට ලෝක ආර්ථිකය ප්‍රතිසංවිධාන කිරීම සඳහා වන බාධකයන් ඉවත් කිරීම ය. කල යුතුව ඇත්තේ එක්සත් ජනපදය මිලිටරි බලය පාවිච්චි කිරීමට දක්වන මොන ම පසුකැඩීමකට හෝ ඉඩ නො තැබීම යයි ඔවුහු තර්ක කරති. යුගෝස්ලාවියාවට එරෙහිව යුද්ධය ඇරඹීමට ටික දිනකට පසු *නිව් යෝක් ටයිම්ස්* පුවත් පතේ තෝමස් ෆ්‍රීඩ්මන් කී පරිදි "වෙලඳ පොලේ සැඟවුනු අත එහි මෙලෙවුනු මිටෙන් තොරව කවර කලෙකවත් ක්‍රියාත්මක නො වෙනු ඇත, මැක් ඩොනල්ඩ්ස් (ආපන ජාලය) එෆ්-15 ගුවන් යානා තනන මැක්ඩොනල්-ඩග්ලස් සමාගමෙන් තොරව ක්‍රියාත්මක නො වනු ඇත. සිලිකන් වැලි පෙදෙස තාක්ෂනයන් සඳහා ලෝකය සුරක්ෂිතව තබන සැඟැවුනු මුෂ්ටිය වනාහී එක්සත් ජනපද හමුදාව, ගුවන් හමුදාව, නාවුක හමුදාව සහ මුහුදුගත භටකාය යි. . . . සන්නද්ධ සේවයේ යෙදුනු ඇමරිකාවකින් තොරව විද්‍යුත් තාක්ෂනික ඇමරිකාවක් නො පවතිනු ඇත."2

## යුද්ධයේ අනාගතය සහ නියත-මෙහෙයුම් අවි වන්දනාව

ඉහත සඳහන් ඉදිරිදර්ශනයේ නිර්ලජ්ජිත හා සවිස්තර වාර්තාවක් මෑත දී පල කරන ලද පොතකින් බලා ගත හැකි ය. *The Future of War* (යුද්ධයේ අනාගතය) නම් මෙම කෘතිය ජෝර්ජ් සහ මෙරිඩිත් ෆ්‍රීඩ්මන් යන දෙදෙනා විසින් ලියන ලද්දකි. මූලෝපායික ව්‍යාපාර තොරතුරු පිලිබඳ විශේෂඥයින් වන මේ දෙදෙනාගේ මූලික තර්කය නම් ඇමරිකාව අත ඇති නියත-මෙහෙයුම් අවි එරටට කෙතරම් ඉහල මට්ටමක යුද්ධමය ආධිපත්‍යයක් අත් කර දී ඇත් දැයි කිව හොත්, එහි ලෝක ආධිපත්‍යය දශක නැති නම් සියවස්

ගනනාවකට සහතික කර දෙනු ඇත. ඔවුහු මෙසේ ලියති:

"යුද්ධය ජාත්‍යන්තර පද්ධතිය හැඩ ගැසීම ද ඒ මත ආධිපත්‍යය දැරීම ද දිගින්දිගට ම සිදුවනු ඇති අතර යුද්ධ කරන ආකාරය නාටකීය ප්‍රතිවර්තනයකට ලක් වෙමින් පවතී; එය ඇමරිකානු බලය ඉමහත් ලෙස වර්ධනය කරනු ඇත. සත්තකින් ම, 21 වන ශතවර්ෂය නිර්නය කෙරෙනු ඇත්තේ එක්සත් ජනපදයේ ඉහවහ යන ස්ථිරසාර බලය විසිනි. අප තහවුරු කරන්නේ ඇමරිකානු බලයේ නැගීම හුදෙක් වර්ෂ පන්සියයක් දිව යන පර්යායක නව මොහොතක් ය යන්න නො වේ; එය වනාහි තථ්‍ය වසයෙන් සාකල්‍යයෙන් ම නව භූගෝලීය පද්ධතිය විවෘත වීම ය. අප ඇතුලු වී සිටින්නේ යුරෝපය වටා භ්‍රමනය වූ ලෝකය, උතුරු ඇමරිකාව වටා භ්‍රමනය වන ලෝකයක් විසින් විස්ථාපනය කෙරෙන සමයකට ය."3 (අවධාරනය ඇඳිනි).

ෆ්‍රීඩ්මන්ලාට අනුව, භූගෝලීය බලයෙහි පිහිටීමේ ලෝක-ඓතිහාසික මාරුවීම, 1991 ගල්ෆ් යුද්ධය විසින් නිවේදනය කරන ලදි. "ඔපරේෂන් ඩෙසර්ට් ස්ටෝර්ම් (ඉරාකයට 1991 දී එල්ල කරන ලද ප්‍රහාරය) තුල දී අත්‍යසාමාන්‍ය දෙයක් සිදු විය"යි ඔවුහු ප්‍රකාශ කරති. "ජයග්‍රහනයේ තනි ඒක පාක්ෂික භාවය, ඉරාක හමුදාවට අති මහත් විනාශයක් අත් කල අතර ඇමරිකානු පැත්තෙන් මුහුන දුන්නේ අතලොස්සකට නො වැඩි යුද හානියක් ය යන්න මිලිටරි බලයේ ගුනාත්මක මාරුවක් පෙන්නුම් කරයි." ඇමරිකානු යුද ජයග්‍රහනයේ ඉහවහ යන ස්වභාවයට හේතුව නම් නියත-මෙහෙයුම් අවි භාවිතය ය. මේවා වනාහි ගුරුත්වාකර්ෂනය හෝ විසි අවි නියාමයන් විසින් ගමන් මග පාලනය නො කෙරෙන අවි ය. තමන්ගේ ම ගමන් මග නිවැරදි කර ගනිමින් ඉලක්කය සොයා ගමන් කිරීමට සමත් "නියත-මෙහෙයුම් අවි භාවිතය යුද්ධයේ සංඛ්‍යානන පදනම පරිවර්තනය කලේ ය. ඒ සමග ම දේශපාලන හා මිලිටරි බලයේ කලනය ද පරිවර්තනය කර ඇත." නියත-මෙහෙයුම් අවි හඳුන්වා දීම වනාහි, මනුෂ්‍ය ඉතිහාසයේ තීරක මොහොතක "ගිනි අවි පාවිච්චිය ඇරඹීම, ෆැලැන්ක්සය (පවුරක් සේ එකට ගැටුනු පලිස්වලින් ආරක්ෂිත විශාල පාබල සේනාංක යොදා ගැනීම -- ග්‍රීකයන් ඇරඹූ යුද ක්‍රමයකි - පරිවර්තක) අස්රිය යුද්ධයට හඳුන්වා දීම සමග එකට සිටින" නව සොයා ගැනීමකි. යුරෝපය "තුවක්කුවෙන් ලොව ජයගත්තේ යම් සේ" ද නියත-මෙහෙයුම් අවි පාවිච්චිය මත වීම ද ඉතිහාසයේ ඇමරිකානු ආධිපත්‍යය ලත් යුගයක ආරම්භය සලකුනු කරයි.4

ෆ්‍රීඩ්මන්ලා මෙසේ නිගමනය කරති: "විසි එක් වන සියවස ඇමරිකානු සියවස වනු ඇත. මෙය අමුතු කියමනක් සේ පෙනී යන්නට ඉඩ ඇත; මන්ද යත්, පොදුවේ පිලිගනු ලැබුවේ ඇමරිකානු සියවස වූයේ විසිවන සියවස බව ය. එහි අවසානය ද සමග ඇමරිකානු ආධිපත්‍යය සමාප්ත වෙමින් පවත්නා බව ය. ඇමරිකානු මැදිහත්වීම පලමු වන ලෝක යුද්ධයේ ප්‍රතිඵලය තීන්දු කල තැන් පටන් අද දක්වා පැවත්තේ හුදෙක් ප්‍රස්තාවනාවක් පමනි. පසුගිය ශතවර්ෂයේ දී දක්නට ලැබුනේ ඇමරිකානු බලයේ දල සටහනක් පමනි; එය සම්පූර්නයෙන් හැඩ ගැස්වී නො තිබූ, සෑම විට ම සංක්‍රමනීය ගැටලුවලින් හා සුලු අභියෝගවලින් -- ස්පුට්නික්, වියට්නාමය, ඉරානය, ජපානය යනාදි -- ආවරනය ව පැවතිනි. ඇමරිකාවේ නුහුරු බව හා අසාර්ථකත්වයන් නව යෞවනයෙකුගේ පය පැකිලීමක් සේ තාවකාලික වැදගත්කමක් දරන්නා වූ ද වැදගැම්මක් නැත්තා වූ ද ඒවා විය."5

නියත-මෙහෙයුම් අවිවල ඓතිහාසික අර්ථය ගැන ෆ්‍රීඩ්මාන්ලාගේ තක්සේරුවේ වලංගු ද නැති ද යන්න පසෙක තැබුවත්, ඔවුන් ඉදිරිපත් කරන අදහස් එක්සත් ජනපදයේ ප්‍රතිපත්ති සම්පාදක ප්‍රභූස්ථරයේ බරපතල ස්ථරයක චින්තනය පිලිබිඹු කරන්නේ ය යන කරුන ම, සැලකිය යුතු වෛෂයික වැදගත්කමක් දරයි. කාලය එලඹ ඇති නරක අදහසක් තරම් භයානක වූ දෙයක් ඇත්තේ නැත. යුගෝස්ලාවියාවට "යටත් වෙනු නැතිනම් විනාශ වනු" යන දෙකින් එකක් තෝරා ගන්නට බල කිරීමට ගන්නා ලද තීන්දුව විසින් පෙන්නා දෙනු ලැබූ පරිදි, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මූලෝපායයෝ, නියත-මෙහෙයුම් අවි විසින් තමන්ට සාර්ථක, ශක්‍ය හා අ-අවදානමකින් යුතු පිලිවෙත් මගක් විවෘත කර දී ඇතැයි ඒත්තු ගෙන සිටිති.

යුද්ධ බලය ඉතිහාසයේ තීරනාත්මක සාධකයක් ය යන්න කිසිසේත් ම අලුත් අදහසක් නො වේ. එහෙත් න්‍යායිකව පරීක්ෂා කෙරෙන විට ඉන් ප්‍රකාශිත කරන්නේ ඓතිහාසික සන්තතියේ සැබෑ හේතුඵල සම්බන්ධතාවන් පිලිබඳ ග්‍රාම්‍ය හා සරලීකෘත සංකල්පයකි. යුද්ධයේ දේශපාලනය ද ආයුධ තාක්ෂනය ද ඉතිහාසයේ සාරභූත සාධක නො වෙති. යථාර්ථයේ දී මේ දෙවර්ගය ම ඉතා සාරභූත සමාජ-ආර්ථික සාධක පදනම් කර ගෙන ද, අවසාන විග්‍රහයේ දී ඒවා විසින් නිර්නිතව ද පැන නගිති. නව අවි ක්‍රමයක් හඳුන්වා දීම ඒ හෝ මේ සටනක නැතහොත් සමහර තතු යටතේ මුලු යුද්ධයක ම ප්‍රතිඵලයට සහතිකෙන් ම බලපානු ඇත. එහෙත් ඉතිහාසයේ පෘථුල ප්‍රසාරය තුල, එය වනාහි යටත් හා අහම්බ සාධකයකි. එක්සත් ජනපදය වත්මනේ අවි ආයුධ කර්මාන්තයේ "තරඟකාරී වාසියක්" භුක්ති විඳිමින් සිටී. එහෙත් මෙම වාසිය හෝ මෙම කර්මාන්තයේ නිර්මාන හෝ ලෝක ආධිපත්‍යය සහතික කරනු නැත. ඇමරිකානු අවි සුතිච්රතා බව සැබවි, එහෙත් ධනවාදයේ කටයුතු තුල එක්සත් ජනපදයේ අති ප්‍රමුඛ ක්‍රියාකලාපයේ මූල්‍ය-කාර්මික අත්තිවාරම, මෙයට වසර 50කට පෙර තිබුනාට වඩා බෙහෙවින් ම බරසාර බවින් අ- ය. ලෝක නිෂ්පාදනයේ ඇමරිකානු පංගුව යස රහට හීනව ගොස් ඇත. එහි ජාත්‍යන්තර වෙලඳ අවාසිය සෑම මසකම ඩොලර් බිලියන ගනනින් වැඩි වී යයි. නියත-මෙහෙයුම් අවි වන්දනාවට යටින් පවත්නා සංකල්පය වන අවි තාක්ෂන ක්ෂේත්‍රයේ ආධිපත්‍යය ජාතික ශක්තියේ වඩාත් අතිමූලික ආර්ථික දර්ශකයන්ගේ පා- මැකීමට සමත් ය යන්න භයංකර මිථ්‍යාවකි. එපමනක් නො ව, කෙතරම් පුපුරනසුලු බලයකින් යුතු වූවත්, කෘෘස් මිසයිල හා එවන් වෙනත් නියත අවිවලට මුදල් සැපයීම ද, ඒවා නිෂ්පාදනය හා පාවිච්චිය ද ධනේශ්වර වෙලඳ පොල නීතිවලට යටත් වන අතර, එහි පරස්පරයන්ට හසු වේ. මෙම අවි නිෂ්පාදනය දැවැන්ත වියදමක් ඉල්ලයි; මතක තබා ගත යුත්තේ ඒවා නිෂ්පාදනය ධන සම්පත් නිර්මානයක් නො ව ඒවායේ විනාශයක් වන බව ය. අවුරුදු ගනනාවක් ගත වන තුරු නිෂ්පාදක ශ්‍රමය විසින් ජනනය කැරුනු ධන සම්පත්, බෝල්කන්හි පුපුරු

වන ලද බෝම්බ සෑදීමට නය වූ මුදල් ගෙවීම සඳහා යෙදීමට සිදු වනු ඇත.

මෙවන් සියුම් ප්‍රශ්න පිලිබඳ ව ඕල්බ්‍රයිට් මහත්මිය සිත් කරදර කර ගනු ඇතැයි අපි නො සිතමු. සත්තකින් ම ආයුධ තාක්ෂනයේ "විශ්මයන්" හා ඉන් ඉටු කල හැකි "හාස්කම්" පිලිබඳ ව වශීකරනය වීම වනාහි, තමන් ඒ ගැන දැන සිටියත්, නො සිටියත් ඓතිහාසික පාතාල කටකට එලඹ සිටින්නා වූ පාලක ප්‍රභූස්ථර අතර බොහෝ විට දක්නට ලැබෙන දෙයකි. ඔවුන්ට ම නො වැටහෙන්නා වූ ද, සම්ප්‍රදායික විසඳුම් නැත්තා වූ ද සංකීර්න ජාත්‍යන්තර හා දේශීය සමාජ-ආර්ථික ප්‍රතිඝතිතතා මාලාවක් විසින් ව්‍යාකූලත්වයට පත් කරනු ලැබ සිටින මෙවැන්නෝ ගැටලු කඩා බිඳගෙන යාමේ මාධ්‍යයක් ලෙස අවි ආයුධ හා යුද්ධය දැක ගතිති.

ප්‍රායෝගික දේශපාලන සම්බන්ධතාවයන්ගේ ප්‍රිස්මය තුලින් දැක ගනු ලබන කල්හි, නියත-මෙහෙයුම් අවි ගැන පවත්නා මුල් බැසගත් විශ්වාසය භයංකර හා ඉවබව නැති එකක් බව පැහැදිලි ය. තාක්ෂනයේ මෙතරම් වේගවත් වර්ධනයක් ඉතිහාසයේ මොන ම කාල පරිච්ඡේදයක වත් දැකගන්නට ලැබී නැත. සෑම ඉදිරි පියවරක් ම කොතරම් විශ්මයාවහ වුව ද වඩාත් අත්‍යසාමාන්‍ය වූ සැලැස්මේ හා ක්‍රියාකාරිත්වයේ නව්‍යකරනයන් විසින් එම වර්ධනයන් ඉක්මවා යාමකට රංග පථය සකසා දෙයි. ජන සංනිවේදන හා තොරතුරු සම්පාදන තාක්ෂනයේ විප්ලවවාදී වර්ධනය නියත-මෙහෙයුම් අවි තාක්ෂනයට සම්බන්ධ ඥානය හා දක්ෂතා අඩු හෝ වැඩි වේගයෙන් පැතිරී යාම සහතික කරයි. දෙවන ලෝක යුද්ධයෙන් පසුව පොරොන්දු වූ "ඇමරිකානු සියවසේ" යුද්ධමය අත්තිවාරම වනු ඇතැයි ජනාධිපති ට්‍රූමන් සහ ඔහුගේ සගයන් විශ්වාස කල එක්සත් ජනපද න්‍යෂ්ටික බල ඒකාධිකාරය, අවුරුදු පහකට වැඩි කලක් පැවතුනේ නැත. නව අවිවල තාක්ෂනය එක්සත් ජනපදයේ තනි අයිතිය ලෙස වැඩි කල් පවතිතැයි සිතීමට හේතුවක් ඇත්තේ නැත. නියත-මෙහෙයුම් අවි නිර්මානය කිරීමේ නායකත්වය පවත්වා ගැනීමට එක්සත් ජනපදය සමත් වුවත්, 1990 ගනන්වල දී ඇමරිකාව ලේ නොහලා යුද්ධ දිනුවාක් මෙන් ඊලඟ දශකයේ දී ද එසේ කල හැකි යයි මෙයින් සහතික නො වේ. එක්සත් ජනපදය විසින් කරන ලද සාහසික ක්‍රියා, ඉන් තමන් තර්ජනයට ලක්ව ඇතැයි සිතන්නා වූ ජාතීන්ට තමන් ද බලගතු ප්‍රතිප්‍රහාරයක් දීමට සූදානම් විය යුතු ය යන පීඩනය අනිවාර්යයෙන් ම උග්‍ර කරනු ඇත. නියත-මෙහෙයුම් අවි තාක්ෂනය වර්ධනය කර ගැනීම හෝ මිල දී ගැනීම තමන්ට අතගැසිය නො හැකි තරම් මිලෙන් වැඩි යයි සිතන රටවල් වුව ද වඩාත් ලාභ එහෙත් අති-මාරක රසායනික, ජීවවිද්‍යාත්මක පමනක් නො ව න්‍යෂ්ටික විකල්ප සොයා ගනු ඇත. රුසියාව අත මෙම විකල්ප අවි තොගයක් දැනුදු පවති. චීනය, ඉන්දියාව, පකිස්ථානය සහ සත්තකින් ම ඊශ්‍රායෙලය අත මෙවන් මාරක අවි තොග යහමින් තිබේ.

ආර්ථික වසයෙන් පසුගාමී රටවල සම්පත් අ-
-තාක්ෂනික අවි ක්ෂේත්‍රයේ එක්සත් ජනපදය සමග තරඟවැදීමට නො සෑහෙන නමුත් යුරෝපය සහ ජපානය සහතිකෙන් ම එසේ කිරීමට සමත් ය. තමන්ගේ ප්‍රකාශ එක්සත් ජනපදයට විරුද්ධත්වයක් හඟවන වචනවලින් නො කිරීමට මේ රටවල් වග බලාගන්නා අතර ම යුරෝපයේ මිලිටරි බලය සැලකිය යුතු ආකාරයකින් වර්ධනය කල යුතු යයි යුරෝපීය විශ්ලේෂකයෝ අවධාරනය කර සිටිති. බ්‍රිතාන්‍යයේ *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත් පත ජූනි 5 දා මෙසේ ලිවී ය: "එක්සත් ජනපදය මත යුරෝපයේ ආධීනතාව කරදරකාරී ලෙස එලිදරව් වී ඇත" තමන්ගේ ම වූ මිලිටරි වැඩපිලිවෙලක් වර්ධනය කර ගැනීමේ "හදිසි බව" අවධාරනය කරමින් එම පුවත් පත මෙසේ කී ය: "මින් අදහස් වන්නේ එක්සත් ජනපදයේ එක් එක් මිසයිලයට මිසයිලය බැගින් හෝ යුද ගුවන් යානයකට යුද ගුවන් යානයක් බැගින් හෝ පිහිටුවීමට යුරෝපය ඉලක්ක කල යුතු ය යන්න නො වේ. නැත; යුරෝපයට එක්සත් ජනපදයේ දුප්පත් නෑදෑයෙකු ලෙස නො ව සමානයෙකු ලෙස උරිනුර පැහැර වැඩ කිරීමට හැකි වන පරිදි, තාක්ෂනික කාර්මික පදනමක් ද වෘත්තීය සංග්‍රාම කෞශල්‍යය ද අත්කර ගත යුතු ය." (අවධාරනය ඇඳිනි).

## අනාගතය කරා ආපසු: 21 වන සියවසේ අධිරාජ්‍යවාදය

ලෝක ඉතිහාසයේ මිනිස් ජීවිත වැඩිම සංඛ්‍යාවක් අතිභයංකර ලෙස විනාශයට පත් කරනු ලැබුවේ විසි වන සියවසේ ප්‍රථම භාගයේ දී ය. ප්‍රථම ලෝක යුද්ධයේ දී (1914-18) හා දෙවන ලෝක යුද්ධයේ දී (1939-45) මිනිස් ජීවිත කෝටි දහයකට වඩා විනාශ කරන ලද බව තක්සේරු කර ඇත. එකල්හි මහ විප්ලවවාදී මාක්ස්වාදීන් විසින් පැහැදිලි කරන ලද පරිදි මෙම යුද්ධයන්ගේ උල්පත පැවතුනේ, නිෂ්පාදන මාධ්‍යයන්ගේ පුද්ගලික අයිතිය මත පදනම් වූ ලෝක ධනවාදයේ අතිමූලික ප්‍රතිඝතිතතා තුල ය. එනම් වෙලඳ පොල ආර්ථිකයේ සාරභූත අරාජකවාදී ස්වභාවය ද නිෂ්පාදන සන්තතියේ වෛෂයිකව සාමාජික වූ ස්වභාවය ද අතර හා තියුනු ලෙස ඒකාග්‍රිත ලෝක ආර්ථිකයක වර්ධනය ද ධනේශ්වර පන්ති සමාජය ඓතිහාසික වසයෙන් මුල් බැස ගත්තා වූ ජාතික රාජ්‍ය පද්ධතිය ද අතර ප්‍රතිඝතිකතා තුලය. ලෝක යුද්ධයන් කෙලින් ම පතනය කරනු ලැබුවේ වෙලඳ පොල, අමුද්‍රව්‍ය සහ ඒ හා බැඳුනු මූලෝපායික අවශ්‍යතා සඳහා ඇති වූ ගැටුම්වලින් ය. දෙවන ලෝක යුද්ධයෙන් පසු එක්සත් ජනපදය මහ ප්‍රමුඛ ධනේශ්වර බලවතා ලෙස ඉස්මත්තට ආවේ ය. ජර්මනිය, ඉතාලිය සහ ජපානය පරාජය කරනු ලැබූහ. යුද්ධයේ වැය විසින් එංගලන්තය සහ ප්‍රන්සය විනාශභාග් කරනු ලැබිනි. පැරනි අන්තර් අධිරාජ්‍ය ප්‍රතිඝතිතතා අතුගෑවී ගියේ නැත; ඒවා එක්සත් ජනපදය සහ සෝවියට් සංගමය අතර සීතල යුද්ධ ගැටුම ඉදිරියේ සිර කොට තබන ලදි.

1991 දී සෝවියට් සංගමය බිඳ වැටීම අන්තර් අධිරාජ්‍ය ගැටුම් මත පැවති දේශපාලන සීමිතතා ඉවත් කර දැමී ය. එක්සත් ජනපදය, යුරෝපය සහ ජපානය අතර තරඟකාරී විජිගීෂාවන් සදහට ම සාමකාමී ව සමනය කල නො හැකි ය. ව්‍යාපාර ලෝකය අතොරක් නැති නිරනුකම්පික තරඟයෙන් සමන්විත ය. අද දෙන ලද තත්‍ව තුල කිසියම් ව්‍යාපෘතියක් තුල ඒකාබද්ධ ව වැඩ කිරීමට සිදුවී තිබෙන මහ සංගත හෙට එකිනෙකාගේ බොටුව ඩැහැ ගනිති. ලෝක පරිමානව මහ සංගතයන් අතර අතොරක් නැති තරගය -- සර්ව-තරගය ප්‍රති-සර්ව (එකිනෙකා අන් සියල්ලට එරෙහිව යුද්ධ කිරීම) -

– අවසානයේ දී තමන්ගේ අතිශය දියුනු හා මාරක ප්‍රකාශනය විවෘත ගැටුම තුලින් අත් කර ගනී. නිෂ්පාදන සන්තතීන්ගේ භූගෝලීය ඒකාග්‍රකරනය අධිරාජ්‍යවාදී රටවල් අතර විවෘත මිලිටරි ගැටුම හීන කර දමන්නේ නැත; ඒ වෙනුවට එය පරස්වාචකව උග්‍ර කර දමයි.

ෆ්‍රීඩ්මන්ලා ලියන සියල්ල අතර එක් නිවැරදි දෙයක් ඇත: "ආර්ථික සහයෝගය ආර්ථික අන්තරායීනතාව වගා කරයි. අන්තරායීනතාව ඝට්ටනය වගා කරයි. ආර්ථික වාසි සෙවීම වනාහි වියරු පියවර ගැනීමට ජාතීන් ඇද දමන උමතු සෙල්ලමකි; මෙය වනාහි ඓතිහාසිකව විදහා දැක්විය හැකි සංසිද්ධියකි."6

1990 ගනන්වල දී උග්‍ර යුද්ධ ඝට්ටන ප්‍රගාමී ව වැඩිවීම වනාහි අත ලඟ එන ජාත්‍යන්තර මහ වන්නියක් පිලිබඳ වෛෂයික ඇඟවීමකි. පලමු වන ලෝක යුද්ධයට මෙන් ම දෙවන ලෝක යුද්ධයට ද පෙරාතුව පලාත්බද හා ප්‍රාදේශීය යුද්ධ ඝට්ටන මාලාවක් එලඹුනි. සෝවියට් සංගමයේ බිඳ වැටීමෙන් ධනේශ්වර කා වැදීමට විවෘත කරන ලද ප්‍රදේශවලට තම බලපෑම පුලුල් කිරීමට ප්‍රධාන අධිරාජ්‍ය බලවතුන් තරක් වන කල්හි ඔවුනතර ඝට්ටනයන් ඇතිවීමේ හැකියාව ද වැඩි වෙයි. කැස්පියන් හා කොකේසස් ප්‍රදේශවලින් කොල්ල කා ගනු ලබන තෙල් බෙදා හැරීම වැනි ප්‍රධාන ඝට්ටනවල දී පරදුවට තැබෙනු ඇත්තේ ලෝක බලය හා තත්වය පිලිබඳ ජීවිතයත්-මරනයත් අතර ප්‍රශ්නයන් ය. මෙවන් ප්‍රශ්න ඒවායේ ස්වභාවයෙන් ම සාමකාමී විසඳුමකට ඉඩ තබන්නේ නැත. අධිරාජ්‍යවාදයේ මූලික ප්‍රවනතාව අනිවාරනීයව නව ලෝක යුද්ධයක් දෙසට ගමන් කරයි.

## බෝල්කන් යුද්ධය සහ ඇමරිකානු මහජන මතය

යුද්ධයට සහයෝගය සම්පාදනය කිරීම සඳහා මාධ්‍යයන් දැරූ සියලු ප්‍රයත්න නො තකා, ඇමරිකානු කම්කරු පන්තියේ -- එනම්, ජනගහනයේ අතිමහත් බහුතරයේ -- ප්‍රතිචාරය කැපී පෙනෙන අයුරු ඉතා කල්පනාකරී විය. යුද්ධ විරෝධයේ සැලකිය යුතු ප්‍රකාශනයන් ඇති වූයේ නැති බව සත්‍යයකි. එසේ ම යුගෝස්ලාවියාවට එරෙහි ප්‍රහාරයට මහජන සහයෝගය බරපතල ආකාරයට ප්‍රදර්ශනය වීමක් ද සිදුවූයේ නැත. ජනමාධ්‍යවේදීන් විසින් යුද්ධයට පක්ෂව දක්වනු ලබන සීමාරහිත උද්යෝගයට ප්‍රතිකූලව වැඩ කරන ජනයා විසින් වඩාත් නිරතුරුව ප්‍රකාශනය කරනු ලබන හැඟීම් නම් ව්‍යාකූලත්වය හා සැක සංකාවයි. යුද්ධය මහජනයා අතර ජනප්‍රියව සාකච්ඡාවට බඳුන් වූ මාතෘකාවක් නො වී ය. යුද්ධය ගැන සිතන්නේ කුමක් දැයි ප්‍රශ්න කරනු ලැබූ කල්හි, වැඩ කරන ජනතාවගේ සාමාන්‍ය පිලිතුර වූයේ, මෙය මොන හේතුවක් නිසා කරනු ලබන්නක් දැයි තමන්ට නො වැටහෙන බව ය. ස්වභාවිකව ම "ජනවාර්ගික සුද්දය" පිලිබඳ ව අසන්නට ලැබී තිබෙන දෙයට ඔවුන්ගේ කැමැත්තක් නැත. එහෙත් ජනමාධ්‍යයන් විසින් තමන්ට විශ්වාස කරන ලෙස කියා ඇති දේට වඩා කොසොවෝ තුල ද පැරනි යුගෝස්ලාවියාව පුරාම ද ගෙන යනු ලැබූ මෙම යුද්ධයේ හේතු සංකීර්න බව කම්කරුවෝ සැක කරති. ගැටුමේ පාර්ශවවල පැහැදිලිව අසමාන බව ද ඇමරිකානු බෝම්බවලින් ඇති වූ බලපෑම ද පලල් මහජනතාවගේ සිත් සාමාන්‍යයෙන් සසල කිරීමට හේතු වී තිබේ. ඇමරිකානු බෝම්බවලින් ඇති වූ විනාශය හා මරන පිලිබඳ ව ප්‍රවෘත්ති හැකි තාක් සීමා කිරීමට ක්ලින්ටන් පාලනය ජනමාධ්‍යවල සහයෝගය ඇතිව ගන්නා ලද පියවරවලින් මෙම තක්සේරුව තහවුරු වේ. යුගෝස්ලාවියාවේ ප්‍රධාන රූපවාහිනී මධ්‍යස්ථානයට බෝම්බ දැමීමේ තීන්දුව ගනු ලැබුවේ, සිවිල් ජීවිත විශාල වසයෙන් විනාශ කල නැටෝ බෝම්බ ප්‍රහාර පිලිබඳ විස්තර තොරතුරු එම රූපවාහිනී මධ්‍යස්ථානය විසින් පතුරුවා හැරීමෙන් පසුව ය. එම ලේවැකි සිද්ධියෙන් පසුව ආ සති කීපය තුල දී යුගෝස්ලාවියාවට එන්නඑන්නම උග්‍ර ලෙස බෝම්බ දැමීමේ බලපෑම ගැන ඇමරිකානු ජනමාධ්‍යවේදීන්ගේ සජීවී වාර්තා කිරීම් මුලුමනින් ම පාහේ නතර විය. පෞද්ගලික අවංකත්ව මාත්‍රයක් හෝ සහිත අන්තිම සීඑන්එන් වාර්තාකරු යයි සමහර විට කිව හැකි බ්‍රෙන්ට් සැඩ්ලර් විසින් එවන ලද රූපවාහිනී වාර්තා නවත්වා දමන ලදී.

මහජන මානසිකත්වය පිලිබඳ ව ක්ලින්ටන් පාලනයට පැවති තක්සේරුව ගැන වඩාත් වැදගත් ඇඟවීමක් නම් යුගෝස්ලාවියාවේ දී ඇමරිකානු ජීවිත පරදුවට තැබීම ගැන මහජනතාව තදබල ලෙස විරුද්ධ යයි එයට පැහැදිලිව ම පැවති විශ්වාසය යි. ඇමරිකානු ජීවිත විනාශ නො වන්නේ නම් වෙනත් රටක මහජනතාව මරා දැමුවාට කමක් නැතැයි පිලිගන්නා මහජන මත තත්වයක සත්තකින් ම විශේෂයෙන් උතුම් වූ කිසිවක් ඇත්තේ නැත. කෙසේ වෙතත් මොන ම මට්ටමක හෝ කැප කිරීමක් කිරීමට මහජනයා සූදානම් නැති යුද්ධයක් වනාහි, ගැඹුරු සහයෝගයක් ඇතැයි ආන්-චකට කියා පෑ හැකි එකක් නො වේ. වියට්නාම් යුද්ධයට එරෙහිව මහජන මතය තීරනාත්මකව ම මාරු වූයේ ඇමරිකානු සොල්දාදුවන් 25,000 ඒ වන විටත් මැරී, තවත් ලක්ෂ ගනනකට තුවාල සිදු වූ පසුව බව මතක් කර ගැනීම වටී.

දෙඩවිලි, විශ්ලේෂන යයි ව්‍යාකූල කොට මහජන මතය වැනි සංකීර්න සහ පරස්පර විරෝධී ප්‍රපංචයක් බොලඳ "විප්ලවවාදී" වචනවලින් අර්ථකථනය කල යුතු යයි කියා සිටින ව්‍යාජ-රැඩිකල්වාදය තරම් බුද්ධිමය වසයෙන් වඳ වූ ද දේශපාලන වසයෙන් නො ගැඹුරු වූ ද දෙයක් ඇත්තේ නැත. යුද්ධයට පක්ෂ හැඟීම් සාපේක්ෂ වසයෙන් නො තිබීම -- එනම් බෝම්බ දැමීමේ ව්‍යාපාරය තුල දී දිගින්දිගට ම පැවති තිබෙන අකර්මන්‍ය එකඟතාවයේ හැඟීම -- යුගෝස්ලාවියාවට එරෙහි අධිරාජ්‍යවාදී ප්‍රහාරයට විරුද්ධ දැනුවත් විරුද්ධත්වයක් සමග සමාන කිරීම නොමග යවනසුලු ද ආත්ම වංචක ද වනු ඇත. එසේ ම මහජන විඥානයේ වත්මන් ව්‍යාකූල තත්වයෙන් අසුබවාදී නිගමන උපුටා ගනිමින් කම්කරු පන්තියේ දේශපාලන දිශාවනතිය තුල වෙනසකට පවත්නා ඉතා සැබෑ විභවය නොතකා හැරීම ද එතරම් ම සාවද්‍ය ය. නො ගැඹුරු අසුබවාදය හෝ සුබවාදය යන දෙකම වෙනුවට අවශ්‍ය වන්නේ බෝල්කන් යුද්ධය කෙරේ විවිධ සමාජ ස්ථරයන්ගේ ප්‍රතිරාවය සැකසූ පන්ති සබඳතාවල වෛෂයික තත්වය පරීක්ෂා කිරීම ය.

## මූල්‍ය උත්පාතය හා අධිරාජ්‍යවාදයේ නව ඡන්ද ක්ෂේත්‍රය

යුගෝස්ලාවියාවට එරෙහි ප්‍රහාරයේ අතිශයින් ම විශේෂ ලක්ෂණයක් අතර කැපී පෙනුනේ (1970 ගනන්වල දී) වියට්නාම් යුද්ධයට විරුද්ධ වූ ද, ප්‍රති-අධිරාජ්‍ය විරෝධතා ව්‍යාපාරවලට සහභාගි වූ ද පුද්ගලයන් විසින් ඉටු කරන ලද ක්‍රියා කලාපය ය. රූපට් මර්ඩොක් විසින් ලේබර් පක්ෂයට නායකත්වය දීම සඳහා තෝරා ගනු ලබන විට මොන ම දේශපාලන ඉතිහාසයක් වත් නො තිබුනු ටෝනි බ්ලෙයාර් හැරෙන විට, නැටෝවේ අනෙකුත් ප්‍රධාන නායකයන් සියලු දෙනා ම, පෙර කල අධිරාජ්‍ය විරෝධීන් යයි කියා ගත් අය ය. කවුරුත් දන්නා පරිදි ජනාධිපති ක්ලින්ටන් අනිවාර්ය යුද සේවය ප්‍රතික්ෂේප කලේ ය, ගංජා දුම් ඇද්දේ ය, එක්සත් ජනපද මිලිටරියට තම විරුද්ධත්වය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කලේ ය. ස්පාඤ්ඤය නැටෝවට ඇතුලත්වීමට විරුද්ධත්වය දැක් වූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදියා, ජාවියර් සොලානා, දැන් එම යුද්ධ සන්ධානයේ මහ ලේකම් ය. ජර්මන් චාන්සලර් (අගමැති) ජෙර්හාර්ඩ් ෂ්රෑඩර් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී තරුන ව්‍යාපාරයේ නායකයා ලෙස මාක්ස්වාදී වාක්‍ය වැගිරවිය, ඔහු අවුරුදු 15කට පෙර පර්ෂිං මිසයිල ස්ථාපනය කිරීමට විරුද්ධ විය. ඔහුගේ විදේශ ඇමති ජොෂ්කා ෆිෂර් 1970 ගනන්වල දී විප්ලවවාදී වීදි සටන්කරුවන් යයි කියා ගත් කන්ඩායමක් මෙහෙය විය; පසුව හරිත පක්ෂයේ නායකයෙකු ලෙස සාමවාදයට අප්‍රතිහත ලෙස කැපවීම ප්‍රකාශ කලේ ය. *නිව් යෝක් ටයිම්ස්* පුවත් පත ජර්මන් විදේශ ඇමතිවරයාගේ මෑත දී ගත් පින්තූරයක් සමග මෙසේ පල කලේ ය: "ජොෂ්කා ෆිෂර් තමා වරක් හෙලා දුටු පිලිවෙත් ම හඬ නගා ආරක්ෂා කරමින් තමන්ගේ ම හරිත පක්ෂයේ මූලධර්මවාදීන් කෝපයට පත් කරයි" ඉතාලි අගමැති මස්සිමෝ අලේමා ඉතාලි කොමියුනිස්ට් පක්ෂය වමේ ප්‍රජාතන්ත්‍ර පක්ෂය ලෙස පරිවර්තනය කිරීමට පෙර එහි නායකයා විය. මේ පුද්ගලයන්ගේ දේශපාලන ඉතිහාසය "වයස 30ට පෙර විප්ලවවාදියෙක්; 30ට පසුව ඌරෙක්" යන සුප්‍රසිද්ධ ප්‍රන්ස ආප්තය හුදෙක් තහවුරු කිරීමක් නො වේ. රට වඩා මෙය දර්ශිත කරන්නේ වත්මන් ධනේශ්වර සමාජයේ පලල් සමාජ ස්ථරයක විකාශනය ය.

සියලු ම ප්‍රමුඛ ධනේශ්වර රටවල සමාජ ව්‍යුහය හා පන්ති සබඳතා, 1980 ගනන්වල ඇරඹුනු කොටස් වෙලඳ පොලේ උත්පාතය විසින් ගැඹුරින් වෙනස් කරනු ලැබ ඇත. නිරතුරුව ඉහල යන කොටස් වටිනාකම්, විශේෂයෙන් ම 1995 දී වෙලඳ පොල අගය පුපුරා ඉහල නැගීම මධ්‍යම පන්තියේ සැලකිය යුතු කොටසකට -- විශේෂයෙන් ම වෘත්තිමය ප්‍රභූස්ථර අතර -- තමන්ගේ වර්යාවේ ආරම්භයේ දී ඔවුන්ට සිතිය නො හැකි තරම් වූ ධනයකට අත ගසා ගැනීමට ඉඩ ලබා දුන්නේ ය. මෙසේ පොහොසත් වූවෝ සැබැවින් ම ජනගහනයෙන් කුඩා ප්‍රතිශතයක් වෙති. එහෙත් සංඛ්‍යාත්මක වසයෙන් ගතහොත් මේ "නව ධනවත්" ප්‍රතිශතය සැලකිය යුතු තරම් බරපතල හා බලවත් සමාජ ස්ථරයකි. ධනපති ආන්- තමන්ගේ කාලයෙන් හා ශක්තියෙන් විශාල කොටසක් මොවුන්ගේ ප්‍රසාරනය වන්නා වූ කෑදරකමට හා වඩවඩාත් අවුරුවන ආශාවන් සන්තර්පනය කිරීමට යොදවති. පෞද්ගලික අයවැය සහ අත තිබෙන මුදල් පිලිබඳ සියලු සුපුරුදු අමාරුකම්වලින් මුලුමනින් ම මුදනු ලැබ සිටින නව පෝසත්තු, චිත්‍රපට, රූපවාහිනී සහ ජනප්‍රිය සඟරා තුලින් පමනක් ජනයාගෙන් අතිමහත් වැඩි කොටසට දැකගන්නට ලැබෙන විභූතියක් තම පුද්ගලික දිවි පෙවෙතේ දී භක්ත වින්දිති. *නිව් යෝක් ටයිම්ස්* පුවත් පත ඇමරිකා එක්සත් ජනපදයේ දේපල වෙලඳ පොලේ නව ප්‍රවනතාවක් පිලිබඳ ව සිත්ගන්නා සුලු අධ්‍යයනයක් මෑත දී පල කලේ ය. "රන් වැනි 1990 ගනන්වල දී, ඩොලර් මිලියනයක් වටිනා මන්දිරය -- හෝ සමහර නගරවල ඩොලර් මිලියන ගනනක් වටිනා මන්දිරය -- සම්ප්‍රදායික ධනපති වැයික්කිවල පමනක් නො ව මෙවන් නිවෙස් ඉතා විරලව පැවති මැද ඇමරිකාවේ මෙම්ෆිස් නගරය වැනි ප්‍රදේශවල ද ඉහල තරාතිරමේ ලාංඡනය බවට පත්ව තිබේ." මෙම මන්දිර *ටයිම්ස්* පත්‍රය කී පරිදි, "ආර්ථික විභේදනයක සංකේතයකි: 1995 ඇරඹුනු උත්පාතයේ දී ජනිත කරන ලද ධනය, බොහෝ අයට දැනුනු අතර, ජාතියේ කුටුම්බයන්ගෙන් පෝසත් ම සියයට පහ අතට අසමානුපාතිකව හා මහා ප්‍රමානයෙන් බෙදී ගොස් ඇත. කොටස් වෙලඳ පොල ඉහල යාම තුලින් වැඩිම ලාභ සාක්කුවේ දමා ගෙන තිබෙන්නේ ඔවුන් ය. එක් රැයින් දහස් ගනන් කෝටිපතියෝ නිර්මානය වී සිටිති. ඔවුහු තමන්ගේ ලාභවලින් විශාල කොටසක් කැපී පෙනෙන ලෙස මහා මන්දිර ගොඩනැගීමට යෙදූහ."

නිව් යෝක් සරසවියේ අර්ථශාස්ත්‍රඥ එඩ්වර්ඩ් එන්. වොල්ෆ්ගේ අධ්‍යයනයක් උපුටා දක්වමින් *නිව් යෝක් ටයිම්ස්* පුවත් පත වාර්තා කලේ: "ඉතිහාසයේ කවර සමයක් වත් මෙතරම් වේගයෙන් පෝසත් මිනිසුන් නිර්මානය කර නැත... අවුරුදු තුනක් ඇතුලත සමස්ත ඇමරිකානු කුටුම්බ සංඛ්‍යාව සියයට තුනකින් ඉහල නැගී අතර ඩොලර් කෝටිපති කුටුම්බ සංඛ්‍යාව සියයට 36.6කින් ඉහල නැගුනි. ඩොලර් මිලියන 10ට ඉහලින් ධන සම්පත් සීමාව තැබුව හොත්, රට අයත් 1995 කුටුම්බයන් 190,000 1998 දී 2,75,000 දක්වා එනම් සියයට 44.7කින් ඉහල නැගුනි."

මෙම ක්‍රියාවලියේ අනෙක් පැත්ත නම්, ඇමරිකානු ජනයාගෙන් අතිමහත් බහුතරයේ ආර්ථික තත්වය එම කාල පරිච්ඡේදය තුල ම පිරිහී ගිය බව ය. *නිව් යෝක් ටයිම්ස්* මෙසේ ලිය යි: "ෆෙඩරල් මහ බැංකුවේ දත්තයන් පිලිබඳ ඔහුගේ විශ්ලේෂනයෙන් වොල්ෆ් මහතා තවත් අභිනිවේෂයක් උපුටා ගනී. මෑත වර්ෂවල දී ජාතියේ කුටුම්බයන්ගෙන් පෝසත් ම සියයට 10ක ආදායමේ ශුද්ධ වටිනාකම ඉහල ගිය අතර ඉතිරි සියයට 90 පසුබැස්සේ ය."7

මෙහි උපුටා දක්වන ලද සංඛ්‍යාවන් වනාහි වත්මන් ඇමරිකාවේ සෑම තැන ම දක්නට ලැබෙන සමාජ අසමානතාව පිලිබඳ එක් ඡායාරූපයක් පමනි. ඇමරිකානු සමාජය තුල පුලුල් වන සමාජ අගාධය ප්‍රජාතන්ත්‍ර අගයයන් තුල මුල් බැස ගත්තා වූ පෘථුල පදනමක සමාජ සම්මතියක් පිලිබඳ මවාපෙන්වීම පවා පවත්වාගෙන ගිය නො හැකි තැනට -- දැනට ම ලඟා වී නැත්නම් -- ඉතා වේගයෙන් ලඟා වෙමින් පවතී. මෙම තත්වය ජනගහනයේ ඉහල සියයට 10 සහ අනෙකුත් සියලු දෙනාගේ සාමාන්‍ය වාර්ෂික ආදායමේ අසමානතාවයෙහි හුදු පරිමාව පිලිබඳ ප්‍රශ්නයක් පමනක් නො වේ. ධන-ජනන සන්තතියේ -- එනම් ඉහල යන කොටස් මිල මගින් පෝසත්වීමේ -- සුවිශේෂ ස්වභාවය ඉතා ස්වභාවිකව ගැඹුරින් ම කම්කරු-විරෝධී හා

අධිරාජ්‍ය-හිත ස්වභාවයක් උසුලන සමාජ හා දේශපාලන ආකල්ප නිෂ්පාදනය කරයි. කොටස් වටිනාකම්වල පුපුරන සුලු ඉහල යාමට ඉඩ සලසමින් වැටුප් මට්ටම් පහත දැමීමට කෙරෙන නිර්දය පීඩනය ද වඩවඩාත් ශ්‍රම ඵලදායිතාව ඉල්ලීම ද සමාජ වියදම් දැවැන්ත ලෙස කපා දැමීම ද ඉහල මට්ටමක සංගත ලාභ තබා ගැනීම සඳහා නිර්දයව කෙරෙන කර්මාන්ත හා රැකියා කප්පාදුව ද ඇමරිකා එක්සත් ජනපදයේ කම්කරු පන්තියේ සමාජ තත්වයට වල කපා තිබේ.

ඩව් ජෝන්ස් හා නස්ඩාක් දර්ශකයන් රොකට් වේගයෙන් අහසට නැගීම, අ- දියුනු රටවල ජීවත් වන්නා වූ ලෝක ජනතාවගේ අතිමහත් බහුතරයට ගැඹුරින් ම ඛේදජනක විය. කොටස් වෙලඳ පොලේ උත්පාතය ඉන්ධන සපයා පවත්වාගෙන ගොස් තිබෙන්නේ අන් සියල්ලටමත් වඩා, අමුද්‍රව්‍ය භාන්ඩ මිල දිගින්දිගට ම පිරිහෙලමින් ගෙන ගිය අවධමනකාරී (නැතහොත් අනුද්ධමනකාරී) වාතාවරනයක් මත පදනම්ව ය. මෙම පිරිහීම සරලව ම වෛෂයික ආර්ථික සන්තතීන්ගේ ප්‍රතිඵලයක් වූයේ නැත, එය "තුන් වන ලෝකයේ" නිෂ්පාදකයන්ට තම මූල භාන්ඩවල මිල ඉහල දැමීමේ හැකියාවට වල කැපීමට ප්‍රධාන අධිරාජ්‍ය බලවතුන් විසින් ගෙන යනු ලබන නිර්දය පිලිවෙත්වල ප්‍රතිඵලයකි. ඔපෙක් තෙල් සන්ධානයේ මිල නියම කිරීමේ ශක්තිය සාර්ථක ලෙස විනාශ කිරීම -- මෙහි ලා 1990-91 ගල්ෆ් යුද්ධය ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කලේ ය -- වනාහි අධිරාජ්‍යවාදී රටවල ධනය ඒකරාශීවීම සහ අ-ඩු දියුනු රටවල් සූරාකෑම උග්‍ර කිරීම පිලිබඳ ඉතාම අර්ථභාරී උදාහරනය ය. දියුනු ධනේශ්වර රටවල, තම ධනය ඉහල යන කොටස් මිල මත රඳවා සිටින උදවිය මෙම සන්තතියෙන් කෙලින් ම වාසි ලබා ඇත. සත්තකින් ම මෙය අදහස් කරන්නේ කොටස් වෙලඳ පොලේ ආයෝජනය කල සෑම ආයෝජකයා ම අධිරාජ්‍යවාදී පිලිවෙත්වල ආධාරකරුවෙක් ය යන්න නො වේ. එහෙත් මේ වෛෂයික ආර්ථික සන්තතීන් හා සම්බන්ධතාවන්ගේ පුලුල් සමාජ හා දේශපාලන ගම්‍යයන් ප්‍රතික්ෂේප කල නො හැක්කේ ම ය.

අධිරාජ්‍යවාදය යටත් විජිතවලින් උකහා ගනු ලැබූ සුපිරි ලාභ ද ඉන් මධ්‍යම පන්තියේ හා කම්කරු නිලධරයේ කොටසක් දූෂනයවීම ද ලෙනින් පලමු වන ලෝක යුද්ධය මධ්‍යයේ සටහන් කලේ ය. 1999 ආර්ථික තත්වයන් හෝ ජාත්‍යන්තර සබඳතා 1916 ඒවා සමග සත්තකින් ම අනන්‍ය නො වන අතර ම, රට සමරූපී සමාජ සන්තතියක් ක්‍රියාත්මකව තිබී ඇත. කොටස් වෙලඳ පොලේ දිග් ගැසුනු උත්පාතයේ වෛෂයික ක්‍රියා විධිය සහ සමාජ ඇඟවීම් ඉහල මධ්‍යම පන්තික ස්ථරවලින් අලුත්, සුවච ඡන්ද ක්ෂේත්‍රයක් අත් කර ගැනීමට අධිරාජ්‍යවාදය සමත් කර ඇත. එක්සත් ජනපදයේ ද, යුරෝපයේ ද පැතිර පවත්නා ජනමාධ්‍යයන් විසින් වගා කරනු ලබන අතර බෙහෙවින් ම වහල් හා දූෂිත ශාස්ත්‍රීය ප්‍රජාවක් විසින් අනුගතව සිටින, ප්‍රතිගාමී තත්වානුගත සහ නරුම බුද්ධිමය පරිසරය, පිලිබිඹු කරන්නේ තමන්ට අලුතින් ලැබී ඇති සම්පත්වල ආර්ථික හා දේශපාලන පදනම් පිලිබඳ ව විවේචනාත්මක පරීක්ෂනයක් කිරීම ධෛර්යමත් කිරීමට කිසිම උනන්දුවක් නැති ජනකායේ ඉහලින් ම වරප්‍රසාදිත ස්ථරයක සමාජ දෘෂ්ටිය යි.

## ඇමරිකානු සහ ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ තත්වය

ධනේශ්වර ක්‍රමයේ පාලක ප්‍රභූස්ථරය සහ පලල් වැඩ කරන ජනස්ථරය අතර වැඩෙන්නා වූ අගාධය පෙන්නුම් කරන්නේ වෛෂයික වසයෙන් ඉහල මට්ටමක පවතින්නා වූ සමාජ හා පන්ති ආතතීන් ය. එක්සත් ජනපදයේ සටන්කාමී කම්කරු ක්‍රියාකාරිත්වයක් නැති තතු තුල මෙම තක්සේරුව වැරදි යයි පෙනී යන්නට පුලුවන. එහෙත් වර්ජන ක්‍රියාවල සහ වෙනත් සමාජ විරෝධතාවන්ගේ හීනවීම ද සමාජ ස්ථාවරත්වයක් ඇඟවුම් කරන්නේ නැත. ඒ වෙනුවට, වේගයෙන් ගැඹුරු වන්නා වූ සමාජ අසමානත්වය තිබිය දී ම, පසුගිය දශකය තුල පන්ති අරගලයේ විවෘත ප්‍රකාශනයන් මෙතරම්මැ අ-වීම ඇඟවුම් කරන්නේ එක්සත් ජනපදයේ පවත්නා දේශපාලන හා සමාජ සංස්ථා කම්කරු පන්තියේ රාශිභූත අතෘප්තියට ප්‍රතිචාර නො දක්වන තැනකට එලඹ ඇති බව ය. වෘත්තීය සමිති වැනි ස්ථාපිත සමාජ සංවිධානයෙන් තව දුරටත් සීමාසහිත ආකාරයකට වුව මහජන දුක්ගැනවිලිවල ඇල මගක් ලෙස ක්‍රියාත්මක නො වෙති. පලල් මහජනතාව සමග මොන ම සම්බන්ධතාවක් වත් නැති ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පක්ෂ කම්කරු පන්තික ජීවිතයේ මූලික ගැටලුවලට විසඳීම් යෝජනා කරනවා තබා, එවන්නක් පවතී යයි පිලිගැනීම හෝ කරන්නේ නැත. කම්කරු පන්තියේ දුක්ගැනවිලි නො තකා හා යටපත් කර තිබෙන කාලය වැඩිවත්, වැඩිවත්, ඒවා වඩවඩාත් පුපුරන සුලු වන්නේ ය. "අවධි ස්කන්ධය" ("critical mass") කරා යම් අවස්ථාවක දී එලඹෙනවාත් සමග ම සමාජ ආතතිය සමාජය මතට එලිපිට ම පුපුරා එනු ඇත.

ඇමරිකානු වෘත්තීය සමිති ව්‍යාපාරයේ පිරිහීම හා අභාවය පසුගිය දශක දෙක තුල එක්සත් ජනපදයේ සමාජ ජීවිතයේ අතිමූලික වෙනස්කම්වලින් එකකි. 1960 ගනන් තරම් මෑත දී වියට්නාම් යුද්ධය පවත්වාගෙන යාමේ දී ජොන්සන් පරිපාලනයට තම පිලිවෙත් කම්කරු පන්තිය කෙරේ කරන බලපෑම නො තකා නො හැකි විය. යුද්ධයේ ඉහල නගින වියදම්, සමාජ සේවා මුදල් කැපීම මගින් පියවිය යුතු යයි ෆෙඩරල් රිසර්ව් (ඇමරිකානු මහ බැංකුව) සහ මහ ධනපති නියෝජිතයන් විසින් කරන ලද ඉල්ලීමට ජොන්සන් ප්‍රතිරෝධය දැක්විය. දරිද්‍රතා පියවරයන් ඒ වන විටත් ඉහල නැග තිබුනු පන්ති හා සමාජ ගැටුම් අවුල උග්‍ර කරනු ඇතැයි ඔහු බිය විය. 1971 දී නික්සන් පාලනය, වඩා හොඳ ජීවන කොන්දේසි සඳහා කම්කරුවන්ගේ ඉල්ලීම්වලට ප්‍රතිරෝධය දක්වමින් වැටුප් මන්ඩලයක් සහ වර්ෂයකට සියයට 5.5ක උපරිම වැටුප් වර්ධක මට්ටමක් ද පිහිටුවීමට උත්සාහ කලේ ය. එසමයෙහි පැවති සමාජ වාතාවරනය, පෙන්නුම් කරන එක් උදාහරනයක් නම්, නික්සන්ගේ වැටුප් සීමා ප්‍රයත්නය "ෆැසිස්ට්වාදය දෙසට ගන්නා ලද ප්‍රථම පියවරය"යි කියමින් එවකට ඇමරිකානු කම්කරු ව්‍යාපාරයේ අන්ත දක්ෂිනාංශිකයා ලෙස සැලකුම් ලැබූ ඒඑෆ්එල් සංවිධානයේ 70 හැවිරිදි වයස්ගත ජෝර්ජ් මීනි පවා හෙලා දුටු බව දැක්විය හැකි ය. පසු කලෙක මීනි තම අලංකාරෝක්ති පසෙකට දමා වැටුප් මන්ඩලය සමග සහයෝගීව ක්‍රියා කිරීමට එකඟ විය. කෙසේ වෙතත්, ඉහවහ යන මහජන විරෝධය සහ වැඩෙන ස්ට්‍රයික් රැල්ල තුල වැටුප් මන්ඩලයෙන් ඉවත්වීමට මීනිට සිදු වූ අතර නික්සන්ගේ වැටුප් පාලක සැලසුම් බිඳ වැටුනි.

1970 ගනන්වලින් ආරම්භ වූ ආර්ථික හා දේශපාලන වර්ධනයන්හි සම්බන්ධතාවේ දේශීය හා ජාත්‍යන්තර වාතාවරනය ඇමරිකානු පාලක පන්තියේ වාසියට අතිමූලිකව පරිවර්තනය විය. ප්‍රථමයෙන් ම, 1973-75 සහ 1979-81 ප්‍රධාන ජාත්‍යන්තර අවපාතය පශ්චාත් දෙවැනි ලෝක යුද්ධ උත්පාතය අවසන් කොට දැමී ය. ඉහල යන විරක්ෂා භාවයේ පසුබිම තුල -- ආන්-ච පෙර නුවූ විරෑ මට්ටමට පොලී අනුපාතික ඉහල දමමින් විරැකියාව දිරිගැන් වීය -- මහ සංගත වෘත්තීය සමිතිවලට විරුද්ධ දික්ගැසුනු ප්‍රහාරයක් ඇරඹී ය. 1981 අගෝස්තු මස, ජනාධිපති රීගන් වැඩ වර්ජක 11,000ක් ගුවන් ගමන් පාලකයන් දොට්ට දමමින් මෙම ප්‍රහාරයට සංඥාව දුනි. ගුවන් ගමන් පාලකයන් ලද පුලුල් මහජන සහයෝගය තිබිය දී ම -- මෙය වොෂිංටනයේ 500,000ක රීගන් විරෝධී පෙලපාලියකින් ප්‍රකාශිත විය -- ඒඑෆ්එල්-සීඅයිඕ සංවිධානය වර්ජකයන් යලි බඳවා ගැනීමට බල කිරීමට පියවර ගත්තේ නැත. ඉන් 1980 ගනන් හරහා 1990 ගනන් දක්වා දිව ඇති රටාවක් අරඹන ලදි. තමන්ගේ වරප්‍රසාදිත තත්වයට තර්ජනයක් ලෙස අනුගාමිකත්වය දැකගත් සමිති නිලධරය, පාලකයන් සමග වඩාත් සමීපව වැඩ කිරීමට අවස්ථාවක් ලෙස මෙම පරාජයන් ගත්තේ ය. 1980 ගනන්වල අවසානය වන විට, එක් කර්මාන්තයකින් තවත් කර්මාන්තයකට කම්කරුවන් ලත් අඛන්ඩ පරාජයන් මාලාවකට පසුව වෘත්තීය සමිති කිසියම් අර්ථාන්විත ආකාරයකට කම්කරු පන්තියේ ආරක්ෂක සංවිධාන ලෙස ක්‍රියා නො කරන තත්වයක් උද්ගත වූයේ ය. 1980 ගනන් මැද වන තෙක් ඇමරිකානු සමාජ ජීවිතයේ නිරන්තර පුපුරා යන ලක්ෂනය ව පැවති ස්ට්‍රයික් සටන්, අවුරුද්දෙන් අවුරුද්ද වාර්තාගත පහත මට්ටම් කරා ඇද වැටුනි. සම්ප්‍රදායිකව කටුක ප්‍රතිරෝධයක් දැනවූ වැටුප් කැපීම් හා මහා රැකියා කප්පාදු කිරීම් දැන් ඇමරිකානු කර්මාන්ත අංශය තුල ඉතා සුලභ දෙයක් බවට පත් විය.

ඇමරිකානු කම්කරු ව්‍යාපාරය සුවිශේෂව ප්‍රහාරයන්ට විවෘත කලා වූ -- ස්වාධීන දේශපාලන සංවිධානයක් නැතිකම, සැලකිය යුතු සමාජවාදී ප්‍රවනතාවක් එය තුල නැතිවීම, විඥානයේ සාමාන්‍ය පහත් මට්ටම සහ අවසාන එහෙත් අනූන කාරනයක් වූ කම්කරු නිලධරයේ දූෂිතතාව හා මැරවර බලයේ තුච්ඡ ලෙස උග්‍ර වීම වැනි -- ඓතිහාසික දුබලකම් පැවතියේ වී නමුත්, එක්සත් ජනපදයේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ බිඳවැටීම වඩා පුලුල් ජාත්‍යන්තර ප්‍රපංචයක කොටසක් විය. ලෝකය පුරා ම කම්කරු පන්තික පැරනි දේශපාලන පක්ෂ ද, වෘත්තීය සමිති ද 1980 මැද පටන් ආන්තික අර්බුදයකට එලඹුනි. මෙම ලෝක පරිමාන පරිහානි සන්තතියෙහි සාරභූත වෛෂයික හේතුව කුමක් වී ද?

## අන්තර් ජාතික සංගත මතුවීම

1970 ගනන්වල හා 1980 ගනන්වල මුල ඇති වූ භූගෝල පරිමාන අවපාත ධනේශ්වර නිෂ්පාදනයේ පාදක රූපවල අතිමූලික වෙනස්කම්වලට තු- දුන්නේ ය. දෙවන ලෝක යුද්ධය අවසානයත් සමග ජාත්‍යන්තර වෙලඳාමේ යෝධ වර්ධනයක් සිදු වී තිබුනු අතර, නිෂ්පාදන සන්තතිය බොහෝ දුරට ක්‍රියාත්මක වූයේ ජාතික රාමුවක් තුල ය. බහු ජාතික සංගතය බොහෝ රටවල් තුල ව්‍යාපාර කල නමුත්, එහි නිෂ්පාදක වැඩ කටයුතු ක්‍රියාත්මක වූයේ ජාතික පදනමක ය. උදාහරනයක් හැටියට, ෆෝර්ඩ් හෝ ජෙනරල් මෝටර්ස් වැනි එක්සත් ජනපද සංගතයක් විවිධ රටවල් තුල කම්හල් පවත්වාගෙන ගිය නමුත් මෙම කම්හල් යොදන ලද්දේ ඒවා පිහිටා තිබුනු රට තුල වෙලඳ පොලට භාන්ඩ නිපදවීම සඳහා ය.

ප්‍රවාහන හා පරිගනකගත සන්නිවේදන තාක්ෂනයන්හි විප්ලවවාදී වෙනස්කම්, ධනේශ්වර නිෂ්පාදනයෙහි සංවිධානයේ හා ශිල්ප ක්‍රමවල ඓතිහාසික වෙනසක් ඇති කල හැකි කලේ ය. සංගත සංවිධානයේ බහු ජාතික රූපය අන්තර් ජාතික සංගතය විසින් අතික්‍රමනය කරනු ලැබිනි. මෙම වෙනසේ සාරභූත අර්ථභාරය වූයේ නිෂ්පාදන හා සේවා ඍජු අන්තර් ජාතික පදනමක සංවිධානය හා සම්බන්ධීකරනය කිරීමට හැකි වූ බව ය. ප්‍රාග්ධනයේ තොරතුරු සම්පාදනයේ යෝධ දෛනික චලනයන් විසින් පෝෂිත වූ අන්තර් ජාතික සංගතයෝ ප්‍රථම වතාවට භූගෝල පරිමානව ඒකාභූත නිෂ්පාදන පද්ධතීන් ස්ථාපනය කිරීමට සමත් වූහ. මෙය ඔවුන්ට තම "තම ජාතික නිජ බිමේ" ශ්‍රම බලකාය ඉක්මවා යාමට ද වැටුප් මට්ටම්වල හා සමාජ සුබසාධනයේ ප්‍රාදේශීය හා මහාද්වීපික වෙනස්කම් සාර්ථකව යොදා ගැනීමට ද අවස්ථාව සලසා දුන්නේ ය.

කම්කරු පන්තියේ පවත්නා එකදු මහජන සංවිධානයක් හෝ තාක්ෂනයේ විප්ලවවාදී වර්ධනයට හා ධනේශ්වර නිෂ්පාදනය මත ඒවායේ ඇති කල දුරදිග යන බලපෑමට සාර්ථක ප්‍රතිචාරයක් වර්ධනය කර ගැනීමට සූදානම් ව සිටියේ වත් සමත් වූයේ වත් නැත. නිල නාම හා රූපික දේශපාලන සම්බන්ධතා -- ඒවා තමන්ට සමාජවාදී, කොමියුනිස්ට්වාදී, කම්කරු හෝ ඇමරිකා එක්සත් ජනපදයේ මෙන් විවෘතව ම ධනවාදයට හා මහ ධනපති පක්ෂවලට පක්ෂපාතී යයි කියා ගැනීම යනාදී -- නො තකාම පැරනි කම්කරු සංවිධාන සියල්ල ජාතික රාජ්‍යය නිෂ්පාදනයේ වෙනස් නො කල හැකි රාමුව ලෙස ගත්හ. ධනේශ්වර සංගතයන් ඒවාට (ජාතික රාමුව තුල) ඍජුව අත් කර ගත හැකි ජාතික කම්කරු බලකාය මත සදාකාලිකව ම ආධීන වෙතැයි උපකල්පනය කල වෘත්තීය සමිති තමන්ගේ තත්වය අනභිභවනීය යයි සලකා ගති. තමන් විසින් ජාතික ශ්‍රම සම්පාදනය පාලනය කල තාක් දුරට, ඒවා සේව්‍ය පක්ෂයෙන් සහන උදුරා ගැනීමේ ශක්තිය සඳහට ම ආරක්ෂා කරගනු ඇත. කම්කරු ව්‍යාපාරයේ මුලුමහත් ප්‍රතිසංස්කරනවාදී දෘෂ්ටිය පදනම් වූයේ මෙම උදාසීන ජාතිකවාදී ඉදිරිදර්ශනය මත ය. මෙම ජාතික ප්‍රතිසංස්කරනවාදී ඉදිරිදර්ශනය අවසන් වසයෙන් මුල් බැස තිබුනේ නිලධරයේ භෞතික අවශ්‍යතා තුල ය. එහෙයින්, මෙම ඉදිරිදර්ශනයේ බිඳ වැටීම ධනවාදයට නිලධරයේ පක්ෂපාතිත්වය සහ යටත්වීම බිඳ දැමුවේ නැත. ඒ වෙනුවට, නිලධරය සිය ශක්තිය යෙදුවේ ජාතික රාජ්‍යය තුල තම වරප්‍රසාද රැක ගැනීම සඳහා කම්කරු පන්තියට වඩා පහත් ජීවන මට්ටමක් පිලිගැනීමට බල කිරීමට උත්සාහ කිරීම මගිනි.

## සෝවියට් සංගමයේ බිඳවැටීම

සෝවියට් සංගමයේ බිඳී විසිරී යාම සහ සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ (සෝස කොපයේ) බිඳ වැටීම වනාහි කම්කරු පන්තියේ පැරනි නිලධරවාදී හා ප්‍රතිසංස්කරනවාදී පක්ෂවල බිඳ වැටීමේ අතිශයින් ම

ආන්තික සහ පුපුරන සුලු ප්‍රකාශන විය. සත්තකින් ම, සෝවියට් සංගමය නියෝජනය කලේ බටහිර යුරෝපයේ හෝ එක්සත් ජනපදයේ වෘත්තිය සමිතිවලට වඩා අතිශයින් සුවිසල් වූ ඓතිහාසික ජයග්‍රහනයකි. සෝසකොපය රාජ්‍ය බලය දරා සිටියේ හා පාලනය කලේ 1917 ඔක්තෝබර් විප්ලවයට ඉක්බිත්තේ නිර්මානය කරනු ලැබූ ජනසතු දේපල රූපවල පදනම මත ය. එහෙත් මේ අර්ථභාරී වෙනස තිබිය දී ම, -- බොහෝ කලකට පෙර කම්කරු පන්තියෙන් බලය උදුරා ගෙන සමාජවාදී විප්ලවයට නායකත්වය දුන් මාක්ස්වාදීන් මුලුමහත් පරම්පරාව ම සමූල ඝාතනය කල -- පාලක ස්ටැලින්වාදී පක්ෂයේ ක්‍රියාමාර්ගය සහ දෘෂ්ටිවාදය අතිමූලික අංශ දෙකකින් දියුනු ධනේශ්වර රටවල කම්කරු නිලධරයන්ගේ පිලිවෙත් සමග සාරභූතව ම සමාන විය.

පලමුවෙන් ම, "සාමකාමී සහජීවනයේ" නිල සෝවියට් ධර්මය බටහිර රටවල කම්කරු නිලධරයන් ක්‍රියාත්මක කල පන්ති සහයෝගයේ ක්‍රෙම්ලින වර්තනය විය. (ස්ටැලින්වාදය මාක්ස්වාදය ම යයි ගෙන යන ලද) ඇමරිකානු මාධ්‍යයන්ගේ උමතු ප්‍රචාරයට ප්‍රතිකූලව, ඇත්ත වසයෙන් මාක්ස්වාදය සෝවියට් සංගමයේ ස්ටැලින්වාදී නායකයන්ගේ පිලිවෙත් සැකසීමට මොන ම ක්‍රියා කලාපයක් වත් ඉටු කලේ නැත. (සෝවියට් සංගමය තුල හා ඉන් පිටත යන දෙකේ ම) විප්ලවවාදී නැගිටීම්වල ශක්‍යතාව කෙරේ නියම සෝවියට් නිලධාරියාගේ ආකල්පය වූයේ පෞද්ගලික භීතිය සහ දේශපාලන විකර්ශනය යි. නිලධරය තුල තමන්ට තිබූ තැන්වලින් අයත් කර ගත් සුඛවිහරන නිදහසේ උපභෝග කිරීමට වඩා අන් කිසි දෙයකට ආශා නො කල ස්ටැලින්වාදී නායකයෝ, ලෝක අධිරාජ්‍යවාදය පෙරලා දැමීම නො ව එයට අනුගතවීමට යත්න දැරූහ.

දෙවනුව, නිලධරය විසින් පරිපාලනය කරන ලද ආර්ථික හා සමාජ ක්‍රියාමාර්ගය තම බටහිර යුරෝපීය ප්‍රතිසංස්කරනවාදී සම සගයන් විසින් යොදා ගැනුනු ජාතිකවාදයේ ම, සුවිශේෂ වර්තනයක් විය. ක්‍රෙම්ලින් තන්ත්‍රය විසින් පිලිගන්නා ලද රිනියා "සමාජවාදය" ප්‍රධාන වසයෙන් ම පදනම් වී ගත්තේ සෝවියට් සංගමය තුල ලබාගත හැකි වූ සම්පත් මත ය. ස්ටැලින්වාදය අපේක්ෂා කලේ ජාතික සුබසාධන රාජ්‍යයේ සෝවියට් වර්තනයකට වඩා වැඩි දෙයක් නො වේ. මෙම ක්‍රියාමාර්ගයේ මූලික මිථ්‍යාව වූයේ සෝවියට් ආර්ථිකයේ වර්ධනය, අවසාන විග්‍රහයේ දී රැඳී පැවත්තේ ලෝක ආර්ථිකය සහ එහි ජාත්‍යන්තර ශ්‍රම විභජනය මත ය යන්න නො තකා හැරීම ය. ජාතික ස්වයංපෝෂිතභාවය මත දියුනු සමාජවාදී සමාජයක් පසෙක තිබියේවා, ශක්‍ය සමාජ සුබසාධක රාජ්‍යයක් පවා පවත්වාගෙන යාමට නො හැකි විය. භූගෝලීයව ඒකාග්‍රිත නිෂ්පාදනය ආරම්භ කිරීම දියුනු ධනේශ්වර රටවල් හා සෝවියට් සංගමය අතර පරතරය පුලුල් කලේ ය. ගැටලුව හුදෙක් තාක්ෂනික නො විය. ස්ටැලින්වාදී පද්ධතිය තුල අන්තර් ජාතික නිෂ්පාදන රූපවලට සරලව ම තැනක් තිබුනේ නැත. සෝවියට් සංගමය සහ නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍ර අතර පවා, ආර්ථික සබඳකම් පැවතුනේ අතිශය ප්‍රාථමික මට්ටමක ය. 1985 දී මිහායෙල් ගොර්බචොව් බලයට එන විට ධනේශ්වර නිෂ්පාදනයේ භූගෝලීයකරනය විසින් ඉස්මතු කර තිබුනු අභියෝගයට ඇමරිකානු සහ බටහිර යුරෝපීය රටවල වෘත්තිය සමිති නිලධරයේ සිටි තම සම සගයන්ට තිබුනාට වඩා හොඳ පිලිතුරක් ඔහුට ද තිබුනේ නැත. ගැඹුරු වන්නා වූ සමාජ දේශපාලන ගැටලුවලට විසඳීමක් සැකසීමට ඔහු දැරූ සියලු වියරු ප්‍රයත්නයෝ නිෂ්ඵල වූහ. ඔක්තෝබර් විප්ලවය පදනම් කරන ලද සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්මයන් අතහැර දැමීමක් මුල සිට ම නියෝජනය කල "තනි රටේ සමාජවාදය" සමග කරන ලද විනෂ්ටක ස්ටැලින්වාදී පර්යේෂනය, 1991 දෙසැම්බරයේ සෝවියට් සංගමය විසුරුවා හැරීමත් සමග ව්‍යසනකාරී අවසානයක් කරා එලඹුනේ ය.

## නායකත්වයේ හා ඉදිරිදර්ශනයේ අර්බුදයක්

කම්කරු පන්තියේ වත්මන් දේශපාලන අවමංගතවීම වඩාත් බෙහෙවින් හොඳින් වටහාගත හැක්කේ පසුගිය දෙදශකය තුල සිදු වූ භූගෝලීය ආර්ථික ප්‍රතිවර්තනයන්ගේ, දේශපාලන ව්‍යසනයන්ගේ සහ සංවිධාන බිඳ වැටීමේ සන්දර්භය තුල ය. සතර අතින් ම සතුරන් විසින් වට ලනු ලැබූ හමුදාවක් ගැන සිතන්න. සටන මැද දී ඔවුන්ගේ විරාගත නායකයෝ අවි ආයුධ ද, අවශ්‍ය කලමනා ද රැගෙන පලා ගොසිනි. අද කම්කරු පන්තිය මුහුන දී සිටින්නේ මීට සම තත්වයකට ය. කම්කරු පන්තිය සහයෝගය දුන්නා වූ ද කම්කරු පන්තිය විසින් විශ්වාස කරනු ලැබුවා වූ ද පක්ෂ හා සංවිධානයන් විසින් එම පන්තිය පාවාදෙනු ලැබ ඇත. කම්කරු පන්තියේ පැරනි සංවිධානයන්ගේ කමකට නැතිකම හුදෙක් ඒවායේ ආත්මීය වැරදි හෝ පෞද්ගලික දූෂනය යන කරුන, ප්‍රශ්නය වඩාත් සංකීර්න කර දමයි. රට වඩා, සත්‍යය නම්, එම තත්වය නිෂ්පාදන විධිය සහ පන්ති සම්බන්ධතාවන් නාටකීයව වෙනස්කර ඇති වෛෂයික ආර්ථික සන්තතීන් තුල එය ගැඹුරට මුල් විහිදුවා ඇති බව ය. එහෙයින්, කම්කරු පන්තියට අවශ්‍යව ඇත්තේ පැරනි සංවිධාන තුල -- වඩාත් නිවැරදිව කිවහොත් ඒවායින් ඉතුරු පහදුව ඇති කොටස්වල -- මුහුනු වෙනස් කිරීමක් නො වේ. අතීතයට ගිය මරපත්, ප්‍රතිගාමී, නිලධරවාදී වෘත්තිය සමිති හා දේශපාලන සංවිධාන යලි පනගැන්විය හැකි "පන පිඹීමක්" ඇත්තේ නැත. ඒවාට ඉක්මනින් පයින් ගසා ඉවත දැමූ තරමට හොඳ ය. දැන් කම්කරු පන්තියට අවශ්‍ය වන්නේ ලෝක ආර්ථිකයේ වෛෂයික ප්‍රවනතාවන්ට මූලෝපාය, ඉදිරිදර්ශනය සහ ක්‍රියාමාර්ගය විසින් සම්පාත වන්නා වූ නව විප්ලවවාදී ජාත්‍යන්තර සංවිධානයකි.

ජාත්‍යන්තර විප්ලවවාදී ව්‍යාපාරයක් ගොඩනැගීමට ශක්‍යතාවක් ඇත්තේ නැතැයි සිතන්නා වූ අසුබවාදීන් සේනාංක ගනන් ඉන්නා බව අපි හොඳින් දනිමු. මෙහි දී අපට සලකුනු කර ගත හැකි කරුනක් නම් අසුබවාදීන් අතර කොහොම වත් හඳුන්නට බැරි අය වනාහි, එතරම් අභූත නො වූ සමයක වෘත්තිය සමිති කෙරේ පූර්න විශ්වාසයක් තබමින් සෝවියට් සංගමයේ සදාකාලික බව ගැන විශ්වාස කල එවුන් බව ය. ඔවුහු ඊයේ නිලධාරිවාදී ලෙස පරිපාලිත ප්‍රතිසංස්කරනවාදය සදහටම පවතී යයි විශ්වාස කලහ. අද රට නො අ-ඩු භක්තියකින් ධනේශ්වර ප්‍රතිගාමීත්වයේ සදාකාලික ජයග්‍රහනය ගැන විශ්වාස කර ගෙන සිටිති. එහෙත් ඊයේ ඇස් නිලංකාර කල සුබවාදයේ ද, අද අපේක්ෂා භංග අසුබවාදයේ ද යටින් පවතින්නේ, අවශ්‍ය ඓතිහාසික රාමුව තුල සිද්ධීන් පරීක්ෂා කිරීමට නො කැමැත්ත හා නො හැකියාව සහ සමාජ ස්ථාවරත්වයේ අතිශයින් ම නොමග යවන සුලු දෘශ්‍යමානයට යටින් පවත්නා පරස්පර විරෝධයන් පරීක්ෂා

කිරීමට නො කැමැත්තක් ද වේ. මෙම බුද්ධිමය දුර්වලතාවන් උග්‍ර කරන්නා වූ වෙනත් ගති ලක්ෂණ -- විශේෂයෙන් ම තම වැටුප් චෙක්පත් විශ්වවිද්‍යාලවල භාණ්ඩාගාරයන්ගෙන් ලබා ගන්නා අය අතර -- පවතී. එනම්, පෞද්ගලික ධෛර්යය, සත්‍යශීලතාවයේ හා සරල අවංකභාවයේ එක්තරා අ-පා-වක් පවතී.

කම්කරු පන්තියේ විප්ලවවාදී ක්‍රියාකලාපය සහ සමාජවාදයේ වෛෂයික ශක්‍යතාව පිලිබඳ විශ්වාසය වනාහි භක්තිය පිලිබඳ ප්‍රශ්නයක් නො වේ, ධනේශ්වර වර්ධනයේ වෛෂයික නියාම පිලිබඳ න්‍යායික අභිනිවේෂයක් සහ -- විශේෂයෙන් ම 20 වන සියවසේ -- ඉතිහාසය පිලිබඳ දැනුමක් පිලිබඳ ප්‍රශ්නයකි.

පසුගිය අවුරුදු අනූනව හමාර තුල රුසියානු, ජර්මානු, ස්පාඤ්ඤ, පෘතුගීසි, ප්‍රන්ස, ග්‍රීක්, චීන, චිලී, ආර්ජන්ටිනා, වියට්නාම්, හංගේරියානු, ඕස්ට්‍රියානු, දකුනු අප්‍රිකානු, ලාංකික සහ ඔව්, ඇමරිකානු කම්කරු පන්තියේ විප්ලවවාදී අරගලවල අ-වක් තිබී නැත. මේ කෙටි ලැයිස්තුව කිසිසේත් ම සම්පූර්න නැත.

එසේ නම්, අප 21 වන සියවසට ඇතුලුවෙමින් පවත්නා තතු තුල කම්කරු පන්තියේ විප්ලවවාදී අරගලයේ නව නැගිට්මක වෛෂයික පදනම කුමක් ද? විරෝධාභාෂීව කිව යුත්තේ, පසුගිය දශක දෙක තුල කම්කරු පන්තිය නො මග යැවීමට ද දුබල කිරීමට ද සාධක වූ ලෝක ධනේශ්වරයේ ඒ වෛෂයික වෙනස්කම් ම විවෘත පන්ති අරගලය යලිත් අලුත් කිරීමට පදනම දමා ඇත්තේ, එයම කලින් හැකිව තිබුනාට වඩා බෙහෙවින් ම පලල් පදනමක් මත ය. පැරනි පන්ති අරගල රූපවල ප්‍රධාන දුබලකම වූයේ ඒවායේ ජාතික හුදෙකලා භාවය යි. කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව ප්‍රකාශයට පත් කොට, සම්මාන ලැබූ තන්හි පවා පන්ති අරගලය ඒකාබද්ධ ජාත්‍යන්තර සන්තතියක් ලෙස වර්ධනයවීමට එරෙහිව වෛෂයික කොන්දේසි වැඩ කලේ ය. එහෙත් මෙම සීමාව අතික්‍රමනය කිරීමේ හැකියාව භූගෝල පරිමානව ඒකාග්‍ර කරනු ලැබූ නිෂ්පාදන සන්තතිය තුල පවතී. ධනවාදයේ මෙම වර්ධනය තම අරගලයන් ජාත්‍යන්තර පදනමක කල යුතුව ඇතැයි යන වෛෂයික අවශ්‍යතාවට කම්කරු පන්තිය මුහුන දෙනවා පමනක් නො වේ; ආර්ථික ප්‍රතිවර්තනයන් විසින් මෙම ජාත්‍යන්තර එකමුතුව ක්‍රියාත්මක කිරීමේ වෛෂයික මාධ්‍යයන් ද නිර්මානය කර ඇත. ප්‍රථමයෙන් ම අන්තර් ජාතික සංගතවල ක්‍රියාකාරිත්වය ද, භූගෝලීය ප්‍රාග්ධන සංචලනයේ ගලා යන සුලු බව ද ජාත්‍යන්තර පරිමානව කම්කරු පන්තියේ ඉමහත් වර්ධනයකට මග පාදා ඇත. මීට අවුරුදු 30ක කාලයකට වත් පෙර නො වූ කාලයේ කම්කරු පන්තියක් නො පැවතියේ යයි කිව හැකි තරම් වූ රටවල, දැන් එය මහජන බලවේගයක් ලෙස ඉස්මතුව ඇත. මෙයට එක් පරපුරකට පෙර කම්කරු පන්තිය සමස්ත ජනගහනයෙන් ඉතා කුඩා කොටසක් ව පැවති නැගෙනහිර ආසියාවේ කම්කරු පන්තිය දැන් කෝටි ගනනකට නැග ඇත.

## ජාත්‍යන්තරවාදය සහ ජාතිකවාදය

පන්ති අරගලයේ භූගෝලීයකරනයට සහ කම්කරු පන්තිය ජාත්‍යන්තරව ඒකාබද්ධ කිරීමට පවත්නා බාධාවන් තාක්ෂනික ස්වභාවයකට වඩා දේශපාලන හා දෘෂ්ටිමය ස්වභාවයක් දරයි. ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ අර්බුදයේ දිග්ගැසුනු අර්බුදය සමහරවිට එහි අතිශයින් ම ප්‍රතිගාමී දේශපාලන පිලිබිඹුව අත්කර ගත්තේ ජාතිකවාදයේ නැගීම හැටියට ය. කම්කරු පන්තියේ විප්ලවවාදී ධාරිතාවන් සහ සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය පිලිබඳ ව දේශපාලන විශ්වාසයක් නැතිකම ජාතිකවාදී ක්‍රියාමාර්ග සහ දෘෂ්ටිවාදයන්ගේ යලි පන ගැසීමට ප්‍රතිපාදක විය. බොහෝ අවස්ථාවල මෙම ප්‍රවනතාවයේ ඓතිහාසික ව පරාගතවාදී ස්වභාවය "ජාතික ස්වයං-නිර්නයේ" හා "ජාතික විමුක්තියේ" ව්‍යාජ-වාම වාචාලයෙන් වසන් කරනු ලැබිනි. ආගම, භාෂාව හෝ ජනවාර්ගිකත්වය මත පදනම් වූ සියලු වර්ගවල ජාත්‍යෝත්තමවාදයට එරෙහිව සටන් කිරීමේ ද විවිධ වර්ගවලට අයත් ජනකායන්ගෙන් සමන්විත රටවල කම්කරු පන්තියේ සියලු කොටස්වල එක්සත් භාවය තහවුරු කිරීමේ දුෂ්කර කර්තව්‍යය මග හැරීමට උත්සාහ දරමින්, අසංඛ්‍ය, සුලු ධනේශ්වර ප්‍රවනතා, ඒ වෙනුවට ඒ හෝ මේ ජාතික ප්‍රජාව මත පදනම් වී ගැනීම තෝරාගෙන ඇත. මාක්ස්වාදී දෙඩවිලි නරුම ලෙස හා බොහෝ විට මුග්ධව යෙදීම මගින්, මෙම ප්‍රවනතාවල පිලිවෙතෙහි සාරභූත අන්තර්ගතය වන්නේ ජාතික හා ජනවාර්ගික අනන්‍යතාව පන්ති විඥානයට ඉහලින් තැබීම ය -- මින් ගලා එන, කම්කරු පන්තියේ වෛෂයික අවශ්‍යතා ජාතික ධනේශ්වරයේ හා සුලු ධනේශ්වරයේ දේශපාලන හා මූල්‍ය අවශ්‍යතාවලට යටත් කිරීම ය -- යන කාරනය වෙනස් කරන්නේ නැත.

ජාතිකවාදී පුනර්ජීවයේ වඩදියෙහි මුදුන් මට්ටම දැනට ම එලඹී ඇතැයි සිතීමට හේතු තිබේ. සත්තකින් ම යුගෝස්ලාවියාවේ සිද්ධීන්ගේ බලපෑම ජාතිකවාදයේ කීර්තියට ද ස්වයං-නිර්නය පිලිබඳ ඉල්ලීමේ විශ්වසනීය භාවයට ද වල කැපීමට සාධක වනු ඇත. බෝල්කන් අර්ධද්වීපය විලෝපනය කල අන්තර්-ප්‍රජාගන ඝට්ටනයේ භයංකරභාවය ජාතිකවාදයේ ප්‍රතිගාමී ඇඟවුම් එලිදරව් කර ඇත්තාහ. යුගෝස්ලාවියාව විසුරුවා හැරීම මගින් අත්කර ගෙන ඇත්තේ කුමක් ද? සර්බියාවේ මිලොසෙවික්ගේ ද, ක්‍රොෂියාවේ තුජ්මාන්ගේ ද, ස්ලෝවීනියාවේ කුකන්ගේ ද බොස්නියාවේ ඉසෙත් බෙගොවික්ගේ ද කාලකන්නි යටිකුට්ටු දස දහස් ගනනකගේ දිවි නසා ඇත. කුමක් සඳහා ද? බෝල්කන් අර්ධද්වීපයේ මුලුමහත් ආර්ථික හා සංස්කෘතික මට්ටම නො මිනිය හැකි ලෙසට පහත දමනු ලැබ ඇත. "ස්වාධීන" බොස්නියාව වනාහි කාලකන්නි අධිරාජ්‍යවාදී වැයික්කියකි. ක්‍රොෂියාව අධිරාජ්‍යවාදීන් දමා ගසන මොන පාන් කැබැල්ලකින් හෝ යැපෙයි. සර්බියාව විනාශ කර දමනු ලැබ ඇත. කොසොවෝව ගතහොත් යටත් ප්‍රදේශ ගනනාවකට බෙදනු ලැබ තිබේ. එහි "ජාතික විමුක්ති ව්‍යාපාරය", එනම් කේඑල්ඒ සංවිධානයට එක්සත් ජනපදය විසින් පත් කෙරුනු සන්නද්ධ මුර සේවය හැර අන් අනාගතයක් නැත. එහි සියලු ම ජාතික හා ආගමික ප්‍රජාවන් සිවිල් යුද්ධවල ගොදුරු බවට පත් වූහ. යුගෝස්ලාවියාව විසුරුවා හැරීම වටා එලඹි සියලු ම සිද්ධීහු ජාතිකවාදය පිලිබඳ කටුක චෝදනා පත්‍රයක් ලෙස නැගී සිටිති.

ජාත්‍යන්තර කම්කරු පන්තියට පාඩම් උකහා ගැනීමට බල කෙරෙන්නා වූ යුගෝස්ලාව් අත්දැකීමේ තවත් අංශයක් ඇත. යුද ගැටුම අත්කර ගත් ඒකපාක්ෂික ස්වභාවය, ජාතික විමුක්ති යුද්ධවල ඉදිරිදර්ශනය වටා පැවති අධිරාජ්‍යවාදයේ පරාජය අත් කර ගත හැකි වනු ඇත්තේ ප්‍රධාන වසයෙන් ම මිලිටරි ගැටුමක් තුලින්

මිස, ලෝක සමාජවාදී විප්ලවයේ විධික්‍රමය තුලින් නො වේ ය යන මිථ්‍යා කතාවලට වල කැපීමට සාධක වනු ඇත. සුලු ධනේශ්වර රැඩිකල් රොමෑන්ටිකවාදියෝ "වියට්නාම් එකක්, දෙකක්, ගොඩක්" යන ගුවේරාවාදී ඉදිරිදර්ශනයට මන්මත් වූහ. එම මායාව දැන් "ඉරාක, එකයි, දෙකයි, ගොඩයි" යන්නට පරිවර්තනය වී ඇත. වියට්නාමය ගැන කුමක් ද? වියට්නාම් මහජනයා කලා වූ සියලු ම වීරෝදාර කැපකිරීම්, අවුරුදු 30ක් තුල ජාතික විමුක්ති යුද්ධ, යන මේ සියල්ල, ඔවුන් අධිරාජ්‍යවාදී ආධිපත්‍යයෙන් ගලවා ගැනීමට සමත් වූයේ නැත. සයිගොන් නගරය අල්ලාගෙන අවුරුදු 25කට පසුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට, ඇමරිකානු බී-52 යානා මගින් නික්සන්ට හෝ කිසිංගර්ට කවර කලෙක වත් කල හැකි වූවාට වඩා වැඩි අනුහසක් හැනොයි පිලිවෙත් මත හෙලීමට හැකිව තිබේ.

අධිරාජ්‍යවාදය පවත්නා තාක් පීඩිත ජාතීන් විසින් කරනු ලබන සන්නද්ධ අරගල පවතිනු ඇත. එහෙත්, අධිරාජ්‍යවාදයට එරෙහි අරගලයේ පාදක හා තීරනාත්මක රූපය වනු ඇත්තේ, කම්කරු පන්තියේ විප්ලවවාදී දේශපාලන අරගලය ය. මෙම රාමුව තුල දියුනු ධනේශ්වර රටවල -- විශේෂයෙන් ම එක්සත් ජනපදයේ -- පන්ති අරගලයේ ඉමහත් ඓතිහාසික වැදගත්කම අවධාරනය කිරීම අ- දියුනු රටවල කම්කරුවන් හා පීඩිත ජනයා කෙරේ මොන ම ප්‍රමානයක හෝ උද්ධච්ච බවක් හෝ පහත් කොට තැකීමක් හඟවන්නේ නැතුවා පමනක් නො වේ; ඒ වෙනුවට ඉහත සඳහන් අවධාරනය ගලා එන්නේ, ජාත්‍යන්තර පන්ති බලතුලනය පිලිබඳ යථාර්ථවාදී තක්සේරුවකින් ද අධිරාජ්‍යවාදී මධ්‍යස්ථානවල සමාජ ප්‍රතිඝතිතාවල පුපුරන සුලු ස්වභාවය පිලිබඳ වැටහීමකින් ද වේ. එක්සත් ජනපදය තුල සමාජවාදී විප්ලවයේ ශක්‍යතාවක් නැතැයි කියන අය ප්‍රායෝගිකව ප්‍රතික්ෂේප කරන්නේ, සමාජ විප්ලවයට හැකියාවක් කොතැනක හෝ නැතැයි යන්න ය. ඔවුහු ඇත්ත වසයෙන් මානව වර්ගයාගේ අනාගතය ගැන මොන ම හෝ බලාපොරොත්තුවක් තැබීම අත්හරිති. ලෝක අරගලයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය කෙතරම් සංකීර්න වුව ද, සිද්ධීන්ගේ නියම අනුක්‍රමය කෙතරම් පෙර දැකිය නො හැකි වුව ද අවසාන ප්‍රතිඵලය කෙරේ එක්සත් ජනපදයේ පන්ති අරගලයේ වර්ධනය තීරනාත්මකව බලපානු ඇතැයි යන්න ගැන මොන ම සැකයක් වත් තිබිය නො හැකි ය.

දැනට, ඇමරිකානු කම්කරු පන්තිය තුල දේශපාලන විඥ්ඥානය ඉතා පහත් ය යන්න නැතැයි කිව නො හැකි සමාජ සංසිද්ධියකි. කෙසේ වෙතත්, මෙය වනාහි, කම්කරුවන් අතර පමනක් නිරීක්ෂනය කල හැකි අ-පා-වක් නො වන බව කීමට ඉඩ දෙනු මැනවි. විඥ්ඥානය සිද්ධීන්ගේ බලපෑම ලබයි -- එම බලපෑම හොඳ පැත්තට හෝ නරක පැත්තට හෝ සිදුවිය හැකි ය. ඇමරිකානු සමාජය යට පවත්නා ප්‍රතිඝතිතතා, අවසාන විග්‍රහයේ දී ප්‍රගාඪ වූ ද, බොහෝ දෙනාට අපේක්ෂා කල නො හැකි වූ ද පරිවර්තනයන් මහජන විඥ්ඥානය තුල ඇති කරනු ඇත. ඇමරිකානු පන්ති සම්බන්ධතා ව්‍යුහයේ ගැබ් වී පවත්නා සමාජ ප්‍රතිඝතිතාවන්ට ප්‍රකාශනයක් අත් කර ගත හැක්කේ කොලම්බස් මහ විදුහලේ සිදු වූ වෙඩි තැබීම වැනි ඛේදනීය හා වික්ෂිප්ත රූපයන්ගෙන් පමනක් යයි කොතැනක හෝ කොටා තබා නැත. මෙම ආතතීන්, වඩාත් මානුෂික, ප්‍රජාතන්ත්‍රවාදී හා විප්ලවවාදී ප්‍රකාශන රූපයන් අත්පත් කර ගැනීමට සමත් ය; එසේ අත්පත් කර ගනු ද ඇත.

## ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ක්‍රියා කලාපය

භූගෝල පරිමානව ඒකාග්‍රිත නිෂ්පාදනයේ උදාව, අප දැනට ම පැහැදිලි කර ඇති පරිදි, කම්කරු පන්තිය ජාත්‍යන්තරව එක්සත් කිරීමට වෛෂයික තත්වයන් නිර්මානය කර ඇතුවා පමනක් නො වේ; ඒ සඳහා මාධ්‍ය ද සකසා දී ඇත. පරිගනකගත සංනිවේදන තාක්ෂනයේ අත්‍යසාමාන්‍ය වර්ධනයෝ, අන් සියල්ලට මත් වඩා ලෝක පරිමාන වෙබ් ජාලය පිහිටුවීම, පන්ති අරගලයේ වර්ධනය සඳහා අතිශය දුරදිග යන ඓතිහාසික ඇඟවුම් දරා සිටිති. මෙම දශකයේ ආරම්භයේ දී යන්තම් හෝ සිතිය නො හැකි වූ ආකාරයකට හා ප්‍රවේගයකින්, බුද්ධිමතුන්, ශිෂ්‍යයන් හා කම්කරුවන් අතර සමාජවාදී හා ප්‍රගතිශීලී දේශපාලන ප්‍රවනතා අතර අදහස් හුවමාරුව සීමා කර දැමුවා වූ ගනන් නැති බාධාවන් අතුගා දමනු ලැබ ඇත. තොරතුරු පතුරුවාලීමේ ලා ධනේශ්වර මාධ්‍යයන්ට පැවති ඒකාධිකාරය දරුනු ලෙස දුබල කරනු ලැබ ඇත. මහජන ශ්‍රාවකයක් කරා ලඟා වීමේ ශක්‍යතාව දැන් ලැබී තිබේ. යුගෝස්ලාවි යුද්ධය අන්තර්ජාලයේ අතිමහත් ශක්‍යතාව සහ දේශපාලන අර්ථභාරය එලිදරව් කලේ ය. යුගෝස්ලාවියාවේ ගුවන් විදුලි මධ්‍යස්ථානවලට බෝම්බ දැමූ පසුව ද නැටෝ ප්‍රහාරයන්හි විපාක පිලිබඳ තොරතුරු අන්තර්ජාලය හරහා ජාත්‍යන්තර ශ්‍රාවකයකට ලබා ගත හැකි විය. රම්බුයියේ සම්මුතියට අමුනන ලද රහස් අතිරේකය වැනි බොහෝ තීරනාත්මක තොරතුරු ජාත්‍යන්තර ශ්‍රාවකයක් කරා ලඟා වූයේ මෙම විශ්මයජනක සංනිවේදන තාක්ෂනය මගිනි.

1998 පෙබරවාරියේ දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* (*www.wsws.org*) පිහිටුවාලී ය. අපි මෙම තාක්ෂනය තුල පලල් ජාත්‍යන්තර ශ්‍රාවකයකට, දෛනික පදනමේ, ලෝක සිද්ධීන් පිලිබඳ මාක්ස්වාදී විශ්ලේෂනයක් ඉදිරිපත් කිරීමට පැවති විභවය දැක ගතිමු. දශක ගනනාවක් තුල නො පැවතුනු ඒ දෙය -- එනම් සැබෑ ජාත්‍යන්තර මාක්ස්වාදී සංස්කෘතියක් -- සම්පාදනය කිරීමේ ලා තීරනාත්මක ක්‍රියා කලාපයක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* ඉටු කල හැකි බව අපි වටහා ගතිමු. අපට අවශ්‍ය වන්නේ සරලීකෘත සටන් පාඨ හෝ දෙඩවිලි නො ව සිද්ධීන් පිලිබඳ බරපතල පරීක්ෂා කිරීමක් යයි අපි ඒත්තු ගතිමු. මාක්ස්වාදය පිලිබඳ ස්ටැලින්වාදී විපරිවර්තනයට ද එය විසින් ඔක්තෝබර් විප්ලවය පාවාදීමට ද එරෙහිව ලියොන් ට්‍රොට්ස්කි විසින් කරන ලද අරගලය දක්වා තම මූලාරම්භය දිවෙන්නා වූ අපගේ ප්‍රවනතාවයේ දීර්ඝ ඉතිහාසය, දිනපතා පුවත් විශ්ලේෂනයක් සඳහා අවශ්‍ය බුද්ධිමය සාරය සපයා දෙනු ඇතැයි අපි විශ්වාස කලෙමු. අපගේ අදහස්වල ශක්තිය ගැන විශ්වාසවන්ත වූ අපි ලෝක පරිමාන පුලුල් දෘෂ්ටි ආස්ථාන පරාසයක් පිලිබිඹු කරන පාඨකයන් සමඟ සාකච්ඡාවක් දිරිමත් කිරීමට උත්සුක වීමු. එවන් සාකච්ඡාවක් සැබෑ ජාත්‍යන්තරවාදී විප්ලවවාදී ක්‍රියාමාර්ගයක් වටා ලෝකය පුරාම සමාජවාදීන්ගේ කැටිගැසීමකට උදව් වනු ඇතැයි අපි විශ්වාස කරමු.

පසුගිය වර්ෂයේ අත්දැකීම් රටවල් දුසිම් ගනනක දහස් ගනන් පාඨකයන්ට *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* භාරගෙන ඇති වැඩ කටයුතුවල වැදගත්කම විදහා දක්වා ඇත. යුගෝස්ලාවියාවට එරෙහි යුද්ධය ඉක්බිත්තේ, දේශපාලන සාකච්ඡාව හා න්‍යායික පැහැදිලි කිරීම සඳහා වඩාත් විශාල හා වඩාත් හදිසි අවශ්‍යතාවයක් පහල වනු ඇත. මෙම සාකච්ඡාවට සහභාගි වන ලෙස ද *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* බලපෑම පුලුල් කිරීමට තමන්ට හැකි සෑම දෙයක් ම කරන ලෙස ද *ලෝසවෙඅ* කර්තෘ මන්ඩලය සිය පාඨකයන්ගෙන් ඉල්ලා සිටී. එ මගිනි සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂයේ වර්ධනය සඳහා අත්තිවාරම් දැමිය හැක්කේ.

පරිවර්තනය- නන්ද වික්‍රමසිංහ

## සටහන්:

1. "Nation, States and War" in *The South Slav Conflict*, edited by Raju G.C. Thomas and H. Richard Friman (New York and London: 1966) p.225.

(දකුනු ස්ලාව් ගැටුම නම් ග්‍රන්ථයේ "ජාතීන්, රාජ්‍ය හා යුද්ධය" - සංස්කරනය: රාජු. ජී.සී. තෝමස් සහ එච්. රිචඩ් ෆ්‍රීමන් (නිව් යෝක් සහ ලන්ඩන්: 1990) 225 පිට.

2. *New York Times*, March 28, 1999.

(නිව් යෝක් ටයිම්ස්, මාර්තු 28, 1999)

3. *The Future of War: Power, Technology & American World Dominance in the 21st Century* (New York: Crown Publishers, 1966). p. ix.

(යුද්ධයේ අනාගතය: බලය තාක්ෂනය හා 21 වන සියවසේ ඇමරිකානු ලෝක ආධිපත්‍යයේ අනාගතය (ක්‍රවුන් පබ්ලිෂර්, 1996) ix පිටුව)

4. එම x පිට.

5. එම 1 පිට.

6. එම 4 පිට.

7. *New York Times*, June 6, 1999

(නිව් යෝක් ටයිම්ස් ජුනි 6, 1999).

© www.wsws.org